චක්‍රලේඛ අංක : 23/2013

පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම

අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය"
පැලවත්ත
බත්තරමුල්ල

ඊඩී/01/12/10/02/01-2013
අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය", පැලවත්ත,
බත්තරමුල්ල.
2013.05.23

චක්‍රලේඛ අංක - 23 / 2013

පළාත් ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන් වෙත.

පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම

පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති 2012.05.29 දිනැති අංක 2012/19 දරන චක්‍රලේඛය හා ඊට අදාළ චක්‍රලේඛ ලිපිවල සියලු විධිවිධාන අභිබවා මෙම චක්‍රලේඛයේ උපදෙස් 2014 වර්ෂය හා ඉන් පසු ව පාසල්වල පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමේ දී බලපානු ඇත.

2.0 ළමයින් ඇතුළත් කිරීම සඳහා මූලික සුදුසුකම්

2.1 පාසලට ඇතුළත් කරන වර්ෂයේ, ජනවාරි 31 දිනට ළමයාගේ වයස අවුරුදු පහක් සම්පූර්ණ විය යුතු ය. මේ සඳහා උප්පැන්න සහතිකය ලබා ගත යුතු වේ. පාසලේ ඇති පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී නොමැති අවස්ථාවක පමණක් ළමයකුට උප්පැන්න සහතිකය නොමැති නම් ඒ වෙනුවට උපන් දිනය සනාථ කිරීමට දිවුරුම් ප්‍රකාශයක් පිළිගත හැකි ය. එහෙත් පසු ව උප්පැන්න සහතිකය ලබා ගත යුතු ය. (වයස අවුරුදු පහට අඩු ළමයින් ඇතුළත් කර නොගැනීමට විදුහල්පතිවරුන් තරයේ වගබලා ගත යුතු ය.)

2.2 පාසලට ඇතුළත් කරන වර්ෂයේ, ජනවාරි 31 දිනට වයස අවුරුදු 6 හෝ 6ට වැඩි ළමයින් ඇතුළත් කළ හැකි වන්නේ වයස අවුරුදු 6 ට අඩු, සුදුසුකම් සපුරා ඇති ළමයින් සියලු දෙනා ම ඇතුළත් කර ගැනීමෙන් පසුව ය.

3.0 තෝරා ගැනීමේ දී අවධානය යොමු විය යුතු කරුණු: (සියලු ම ගණ සඳහා අදාළ වේ.)

3.1 පළමුවන ශ්‍රේණියේ සමාන්තර පන්තියක් සඳහා ළමයින් 30 දෙනෙකු ප්‍රථම සම්මුඛ පරීක්ෂණයෙන් ද එම 30 දෙනාත් සමග තවත් ළමයින් තිදෙනෙකු අභියාචනා හා විරෝධතා පරීක්ෂණයෙන් ද වශයෙන් ළමයින් 33 දෙනෙක් තෝරා ගත යුතු ය. ඊට අමතර ව ළමයින් 07 දෙනෙක් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටින හෝ යෙදී සිටි ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයන්ගේ දරුවන්ගෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ නිර්දේශ මත තෝරා ගනු ලැබේ. මුළු සංඛ්‍යාව 40කි.

3.2 1960 අංක 05 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) හා 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) යන පනත් අනුව රජයට පවරා ගන්නා ලද පාසල්වල පුරප්පාඩු පිරවීමේ දී පවරා ගන්නා අවස්ථාවේ තත් පාසලේ සිටි ආගමික සිසු අනුපාතය සැළකිල්ලට ගෙන පුරප්පාඩු සංඛ්‍යාව ආගම් අනුව හා එක් එක් ගණ අනුව බෙදා වෙන් කළ යුතු ය. යම් ආගමක එක් ගණයකට වෙන් කරන ලද ප්‍රමාණයට වඩා අඩු අයදුම්කරුවන් ප්‍රමාණයක් ඇති කල්හි එම පුරප්පාඩු එම ආගමට අයත් සෙසු ගණ අතර අනුපාතික ව බෙදා හැරිය යුතු ය. යම් ආගමකට අයත් අයදුම්කරුවන් නොමැති විට හෝ අඩුවෙන් සිටින විට හෝ එම පුරප්පාඩු අනුපාතික ව අනිකුත් ආගම් අතර බෙදා හැරිය යුතු ය.

3.3 මව්පියන් පදිංචි ව සිටින්නේ එක ම ස්ථානයක නොවන කල්හි ඔවුන් නීතියෙන් වෙන් නොවූ අය නම් ඒ අය නීතියෙන් වෙන් වීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වූ ලිපි ලේඛන මගින් ගෙන ඇති ක්‍රියාමාර්ග සනාථ කර ඇති විට ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කර ඇති අයගේ (පියා හෝ මව) පදිංචි ස්ථානය, ළමයා පදිංචි ස්ථානය වශයෙන් සළකනු ලැබේ.

3.4 උසාවි තීන්දුවක් මගින් නීත්‍යානුකූලව ස්ථිරව දරුකමට හදා ගැනීම සඳහා පත් කරනු ලැබූ පුද්ගලයකු පමණක් භාරකරු වශයෙන් පිළිගනු ලැබේ. අනාථ නිවාසවල සිටින ළමයින්ගේ නිත්‍යානුකූල භාරකරු වශයෙන් නිවාසයේ භාරකරු සළකනු ලැබේ. නීත්‍යානුකූලව දරුකමට හදා ගන්නා පුද්ගලයා විසින් ඒ පිළිබඳ උසාවි තීන්දුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර ලබා තිබිය යුතු ය.

3.5 මව්පියන්/ නීත්‍යනුකූල භාරකරුවන් පාසල අයත් පරිපාලන දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ පදිංචි වී සිටිය යුතු ය. යම් පාසලක් පරිපාලන දිස්ත්‍රික් බල ප්‍රදේශ මායිමක පිහිටා ඇති අවස්ථාවක මායිමේ ඇති අනෙකුත් පරිපාලන දිස්ත්‍රික්කයේ ආසන්න ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පදිංචිකරුවන්ට ද එම පාසලට අයදුම් කළ හැකි ය. මෙය අදාළ පාසලේ පෝෂිත ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලැබේ. ආදි ශිෂ්‍යයන් සඳහා මේ සීමාව බල නො පැවැත්වේ.

3.6 රජයේ හෝ අනුමත පෞද්ගලික හෝ වෙනත් පාසලකට පෙර වර්ෂයක දී ඇතුළත් කර ඇති ළමයකු මෙම වර්ෂයේ දී පළමුවන ශ්‍රේණිය සඳහා ඇතුළත් කිරීමට සුදුසු නොවන්නේ ය.

4.0 ළමයින් ඇතුළත් කිරීම සඳහා අයදුම්කිරීමේ කාර්ය පටිපාටිය –

4.1 සෑම වර්ෂයක ම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඊළඟ වර්ෂය සඳහා පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන මව්පියන්ගෙන් හෝ නීත්‍යනුකූල භාරකරුවන්ගෙන් අයදුම්පත් කැඳවන දැන්වීම (අයදුම්පත් කැඳවීම අවසන් කරන දින සහිත ව) පුවත්පත්වල පළ කරනු ඇත.

4.2 මව්පියන්/ නීත්‍යනුකූල භාරකරුවන් තම දරුවා පාසලකට ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන්නේ නම් තමන් කැමති හා පහසු පාසල්වලට අදාළ වර්ෂය සඳහා පුවත්පත්වල පළ කරනු ලබන මෙම චක්‍රලේඛයේ අංක 01 උපලේඛනයේ සඳහන් ආකෘති පත්‍රයට අනුව සාදා ගත් අයදුම්පත්‍ර පමණක් අදාළ පාසලේ විදුහල්පති වෙත ඉදිරිපත් කළ යුතු ය.

4.3 ක්‍රියාන්විත රාජකාරි සඳහා ලබා දෙන විශේෂ අනුග්‍රහය යටතේ තම දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමට අපේක්ෂා කරන ක්‍රියාන්විත රාජකාරියේ යෙදෙන/ යෙදුණු ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ සාමාජිකයින් සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් තම ඒකක වෙත නිකුත් කරනු ලබන විශේෂ අයදුම්පත් විධිමත් ව සම්පූර්ණ කර තම ඒකක හරහා අදාළ සුභසාධක අධ්‍යක්ෂ වෙත නියමිත දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය. අනෙකුත් සියලු ම මව්පියන්/ නීත්‍යනුකූල භාරකරුවන් අදාළ පාසලේ විදුහල්පති වෙත අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර ලැබෙන සේ තම අයදුම්පත් සමග තම නම, ලිපිනය, සඳහන් ලියාපදිංචි තැපැල සඳහා අවශ්‍ය මුද්දර සහිත ලියුම් කවරයක් ද ළමයා ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් පිළිබඳ තමන් විසින් ම සහතික කළ ලිපි ලේඛනවල පිටපත් ද ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවෙන් අයදුම්පත් ලැබෙන පාසල්වල පමණක් මේ අයදුම්පත් අතින් වුව ද භාර ගත හැකි අතර, අතින් භාර ගන්නේ නම් භාර ගත් බවට ලදුපතක් ලබා දිය යුතු ය.

4.4 ක්‍රියාන්විත රාජකාරියේ යෙදෙන/ යෙදුණු ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයන්ගේ දරුවන් සෘජු ව ම පාසලට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන්නේ නම් අදාළ පාසලේ විදුහල්පති වෙත ද අයදුම්පත් ඉදිරිපත් කළ හැකි ය.

4.5 මව්පියන්/ නීත්‍යනුකූල භාරකරු එක් පාසලකට ගණ කිහිපයක් හෝ මාධ්‍ය දෙකක් යටතේ ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන්නේ නම් එම එක් එක් ගණයට හා මාධ්‍යයට වෙන වෙන ම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලි ව ගණය ලියා එවිය යුතු ය.

4.6 යම් පාසලකට ඉල්ලුම් කළ පුද්ගලයකු තමාට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ඇති තවත් පාසල් කිහිපයකට ද අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. මෙහි දී ජාතික පාසල් ඉල්ලුම් කරනු ලබන පුද්ගලයකුට අවම වශයෙන් පළාත් පාසල් 03ක් ඇතුළත් වන පරිදි උපරිම වශයෙන් පාසල් 06ක් ඉල්ලුම් කළ හැකි වන අතර, ප්‍රමුඛතා අනුව අයදුම් කරන පාසල් අයදුම් පත්‍රයෙහි සඳහන් කළ යුතු ය.

4.7 ඉගැන්වීමේ මාධ්‍ය දෙකක් (සිංහල හා දෙමළ) ඇති පාසල්වලට මාධ්‍ය දෙක සඳහා ම ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මාධ්‍ය දෙක සඳහා ම ඉල්ලුම් පත් ඉදිරිපත් කළ හැකි ය. එහෙත් එක් මාධ්‍යයකින් පාසලකට තේරුණු පසු ව එම මාධ්‍ය වෙනස් කිරීමට ඉඩදෙනු නො ලැබේ.

5.0 තෝරා ගැනීමේ කාර්ය පටිපාටිය

5.1 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව පාසලේ පළමු වන ශ්‍රේණියට පාසල මඟින් ඇතුළත් කළ හැකි ළමයින් සංඛ්‍යාවට වඩා අඩු වන්නේ නම් ළමයාගේ උප්පැන්න සහතිකය මඟින් වයස සනාථ කර ගැනීමෙන් පසු ව අදාළ දිනයට පාසලට ඇතුළත් කර ගත හැකි ය.

5.2 නියමිත දිනට ලැබූ අයදුම්පත් සංඛ්‍යාව පාසලේ පළමුවන ශ්‍රේණියට පාසල මඟින් තෝරා ඇතුළත් කර ගත හැකි ළමයින් සංඛ්‍යාවට වඩා වැඩි වන්නේ නම් පමණක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් තෝරා ගැනීම් කළ යුතු ය. එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අදාළ පාසලේ විදුහල්පති විසින් තෝරා ගත යුතු ය. මෙහි දී පාසල් සංවර්ධන කමිටු/ පාසල් සංවර්ධන සමිති, ආදි ශිෂ්‍ය සංගම් නියෝජිතයන් තෝරා ගැනීමේ දී මෙම කමිටු හෝ සංගම්වල කාරක සභාවේ එකඟතාව මත පුද්ගලයකු පත් කර ගත යුතු ය. තව ද තෝරා ගැනීම් පිළිබඳව ජාතික පාසලක් නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට හෝ ලේකම් විසින් බලය පැවරූ නිලධාරියකුට ද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකට ද, පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකට ද වාර්තා කළ යුතු ය.

5.3 මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සංයුතිය පහත සඳහන් පරිදි විය යුතු ය:-

(අ) අදාළ පාසලේ විදුහල්පති (සභාපති);

(ආ) අදාළ පාසලේ ප්‍රාථමික අංශ ප්‍රධානියා/ ප්‍රාථමික අංශයේ ජ්‍යෙෂ්ඨ ගුරුවරයෙක්;

(ඇ) අදාළ පාසලේ වසරකට වැඩි සේවා කාලයක් සහිත නියෝජ්‍ය/ සහකාර විදුහල්පති හෝ ජ්‍යෙෂ්ඨ ගුරුවරයෙක්. (ලේකම්);

(ඈ) පාසල් නගා සිටුවීමේ පාසල් සංවර්ධන කමිටු/ පාසල් සංවර්ධන සමිති නියෝජිතයෙක් (එම පාසලේ ආදි ශිෂ්‍යයෙක් හෝ පාසලේ ගුරුවරයෙක් නොවිය යුතු ය.);

(ඉ) ආදි ශිෂ්‍ය සංගම් නියෝජිතයෙක්;

5.4 අදාළ පාසලේ විදුහල්පති සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති වන අතර, වසරකට වැඩි සේවා කාලයක් ඇති නියෝජ්‍ය/ සහකාර විදුහල්පතිවරයා හෝ ජ්‍යෙෂ්ඨ ගුරුවරයා ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේත්/ අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේත් ලේකම් වශයෙන් කටයුතු කළ යුතු ය.

5.5 තමන්ගේ දරුවකු හෝ මුණුබුරකු/ මිණිබිරියක පාසලකට ඇතුළත් වීමට අයදුම් කර ඇති විට ඔහුට/ ඇයට එම පාසලේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකත්වය දැරිය නො හැකි ය. එහෙත් මෙය විදුහල්පතිට අදාළ නොවේ. තව ද විදුහල්පති හා ප්‍රාථමික අංශ ප්‍රධානියා හැර අනිකුත් සියලු ම සාමාජිකයන් අදාළ පාසලේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙහි පසුගිය වසර 02ක කාලය තුළ නො සිටි අය විය යුතු ය.

5.6 පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම සඳහා පත් කරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ළමයින් තෝරා ගැනීමට අදාළ ව සියලු ම සාධක සළකා බලා සුදුසු පරිදි තීරණ ගෙන ක්‍රියාත්මක කිරීමේ බලතල හිමි වේ. එහෙත් ලබා දී ඇති චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල වන පරිදි තෝරා ගැනීමේ කටයුතු කරගෙන යා යුතු අතර චක්‍රලේඛයේ සඳහන් කරුණු පිළිබඳ විග්‍රහ කර ගැනීම ද, තෝරා ගැනීමේ ගැටලු පිළිබඳ තීරණ ගැනීම ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ වගකීම වේ. එසේ වුව ද මෙසේ ගනු ලබන තීරණ හා විග්‍රහ කිරීම් පිළිබඳ ව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති විසින් කෙටියෙන් ලොග් සටහන් තැබිය යුතු අතර වෙන ම වාර්තා පොතක වාර්තා කර අවශ්‍ය අවස්ථාවල දී ඉදිරිපත් කිරීම පිණිස සුරක්ෂිත ව තබා ගත යුතු ය.

6.0 තෝරා ගැනීම සඳහා උපයෝගී කර ගන්නා ක්‍රමවේදය

(අ) යම් පාසලක පළමුවන ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩුවලින් ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මගින් තෝරා ගන්නා ළමයින් සංඛ්‍යාව මෙහි දැක්වෙන ගණවලට අයත් ළමයින් අතරින් පහත සඳහන් ප්‍රතිශත අනුව පිරවිය යුතු ය:-

I.	පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්	50%
II.	තත් පාසලේ ආදි සිසු/ සිසුවියන් වන මව්පියන්ගේ දරුවන්	25%
III.	එවකටත් තත් පාසලේ අධ්‍යාපනය ලබන සිසු/ සිසුවියන්ගේ සහෝදර/ සහෝදරියන්	15%
IV.	අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ දරුවන්	05%
V.	රජයේ අවශ්‍යතා මත ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු නිලධරයන්ගේ දරුවන්	04%
VI.	ළමයා සමඟ විදේශගතව සිට පැමිණෙන තැනැත්තන්ගේ දරුවන්	01%

(ආ) ළමයින් තෝරා ගැනීමේ දී ඉහත සඳහන් ගණයකට අයත් ළමයින් සංඛ්‍යාව සම්පූර්ණ නො වන්නේ නම් අඩු වන ළමයින් සංඛ්‍යාව අනෙකුත් ගණ අතර ඉහත සඳහන් අනුපාතවලට අනුව බෙදා හැර තෝරා ගත යුතු ය.

(ඇ) එක් එක් ගණ යටතේ සඳහන් කර ඇති ලකුණු ක්‍රමයට අනුව තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබා දිය යුතු ය. මෙහි දී ලබා දිය හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 100 ක් වේ.

(ඈ) සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවලින් එක් ලේඛනයක් හෝ නීත්‍යනුකූල නො වන ලේඛනයක් වන්නේ නම් එම හේතුව නිසා ම අයදුම්පත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය.

(ඉ) ඡන්දහිමි නාම ලේඛනයේ තම නම් ලියාපදිංචි වී ඇති බව ග්‍රාම නිලධාරි කාර්යාලයේ ඇති ඡන්දහිමි නාම ලේඛන අනුව සටහන් කරගෙන මව්පියන් / නීත්‍යනුකූල භාරකරු විසින් ම සහතික කර ඉදිරිපත් කල යුතු ය. මෙම විස්තර සටහන් කර ගැනීම සඳහා පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමේ ඉල්ලුම් පත්‍රයේ ඉඩකඩ සළසා දී ඇත. ඡන්ද හිමි නාම ලේඛනවල ලියාපදිංචි වූ විස්තර ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන මව්පියන්/නීත්‍යානුකූල භාරකරුවන් මෙම කොටස අනිවාර්යයෙන්ම සම්පූර්ණ කළ යුතු ය.

(ඊ) පදිංචිය සනාථ කිරීමට අදාළ ලිපි ලේඛන ඉල්ලුම් කරන අවස්ථාවේ දී පදිංචි ව සිටින ස්ථානයට අදාළව තිබිය යුතු ය.

6.1 පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන් - 50%

මෙම ගණය යටතේ පෝෂිත ප්‍රදේශය (3.5 උප වගන්තියට අනුව) තුළ පදිංචි සියලු දෙනාට ම අයදුම් කළ හැකි ය. මෙහි දී පදිංචිය වැදගත් වේ. පහත සඳහන් ලකුණු ක්‍රමයට අනුව මේ ගණය යටතේ තෝරා ගැනීම සඳහා ලකුණු ලබා දිය යුතු ය:-

I. පදිංචිය

ඡන්දහිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී ඇති බව සටහන් කිරීමට අයදුම්පතෙහි ලබා දී ඇති කොටස (අංක 06) සම්පූර්ණ කර ලියාපදිංචිය සනාථ කළ යුතු ය.(ඡන්ද ලේඛනයේ නම් සඳහන් වසර ගණන අනුව ලකුණු ලබා දිය යුතු ය.)

- ❖ ඡන්ද හිමි නාම ලේඛනයේ ඉල්ලුම්කරු හා ඉල්ලුම්කරුගේ කලත්‍රයාගේ නම් හෝ නීත්‍යනුකූල භාරකරුගේ නම ලියාපදිංචි ව ඇත්නම් අයදුම් කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට ආසන්න වර්ෂ 05ක් සඳහා වර්ෂයකට ලකුණු 07ක් බැගින් ලකුණු 35

  (පෙර වර්ෂවල ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිව සිටි ඉල්ලුම්කරු/ කලත්‍රයා විදේශගත ව සිටී නම් හෝ මිය ගොස් ඇත්නම් හෝ නීත්‍යනුකූලව දික්කසාද වී ඇත්නම් හෝ ලිපි ලේඛන සලකා බලා අදාළ ලකුණු ලබා දිය යුතුය.)

- ❖ ඡන්ද හිමි නාම ලේඛනයේ ඉල්ලුම්කරුගේ හෝ කලත්‍රයාගේ නම පමණක් ලියාපදිංචි ව ඇත්නම් අයදුම් කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට ආසන්න වර්ෂ 05ක් සඳහා වර්ෂයකට ලකුණු 05 බැගින් ලකුණු 25 (උපරිම ලකුණු 35)

සැ.යු.- පදිංචිය සඳහා ලකුණු ලබා දෙන්නේ දැනට පදිංචි වී සිටින ස්ථානයේ ලිපි ලේඛන මගිනි. එහෙත් දැනට පදිංචි වී සිටින ස්ථානයේ පදිංචි වීමට පෙර පෝෂිත ප්‍රදේශය තුළ තවත් ස්ථානයක පදිංචි වී සිටි අයදුම්කරුවකු තම අවම වසර 05ක පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්දහිමි නාම ලේඛන ස්ථාන දෙකෙන් ම ඉදිරිපත් කරන විට පහත පරිදි කටයුතු කළ යුතු ය.

ඉල්ලුම්කරනු ලබන පාසලට වඩා ආසන්නයේ අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි පාසල් සඳහා අඩු කරනු ලබන ලකුණු, නොවෙනස් වන්නේ නම් පමණක් ස්ථාන දෙකෙන් ම ඉදිරිපත් කර ඇති ඡන්දහිමි නාම ලේඛන දැනට පදිංචි ස්ථානයේ ඡන්දහිමි නාම ලේඛනය සේ සළකා ලකුණු ලබා දිය යුතු ය.

II. පදිංචිය තහවුරු කරන ලේඛන

අදාළ පුද්ගලයාගේ නමට පදිංචිය තහවුරු කරන ලේඛනය පැවරී වසර 05ක් හෝ ඊට වැඩි කාලයක් ගත වී ඇත්නම් සම්පූර්ණ ලකුණු ද වසර 05ට අඩු හා වසර 03ක් හෝ ඊට වැඩි කාලයක් ගත වී ඇත්නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 75%ක් ද වසර 03ට අඩු නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 50%ක ලකුණු ප්‍රමාණයක් ද ලබා දිය යුතු ය.

පදිංචි ස්ථානයේ හිමිකම් ඔප්පුව

- ඉල්ලුම්කරුගේ/ කලත්‍රයාගේ නමට පදිංචි ස්ථානයේ හිමිකම් ඔප්පුව ඇත්නම් (පැවරුම්/ තෑගි) - ලකුණු 10
- ඉල්ලුම්කරුගේ/ කලත්‍රයාගේ මවගේ හෝ පියාගේ නමට පදිංචි ස්ථානයේ හිමිකම් ඔප්පුව ඇත්නම් (පැවරුම්/තෑගි)-ලකුණු 06
  (අනෙකුත් අයගේ නමට ඇත්නම් මෙම ලකුණු ලබා නො දිය යුතු ය.
  විහාරගම් පනත යටතේ දෙනු ලබන ලියවිල්ල ආදිය ප්‍රදේශයට අනුව පිළිගත හැකි ය. තව ද පත්ඉරු හා දේවන පිටපත් පරීක්ෂා කර තහවුරු කරගත හැකි ය.)

සැ.යු.- ඉල්ලුම්කරුගේ දෙමාපියන්ගේ නමට පදිංචි ස්ථානයේ අයිතිය තිබීමෙන් පසු ව ඉල්ලුම්කරුගේ නමට අයිතිය ලබා දී ඇති අවස්ථාවක එසේ අයිතිය පැවරීමෙන් පසු ගත වී ඇති කාලය වසර 03ට වඩා අඩු වන්නේ නම් දෙමාපියන්ගේ නමට හිමිකම් ඔප්පුව තිබුනා සේ සළකා සම්පූර්ණ පදිංචි කාලය වසර 05 ට වැඩි වන්නේ නම් පමණක් ලකුණු 06ක් ලබා දිය යුතු ය.

- ලියාපදිංචි බදු ඔප්පුව/රජයේ නිල නිවාස ලේඛනය/නිත්‍යානුකූලව පිළිගත හැකි අයිතිය තහවුරු කෙරෙන වෙනත් ලේඛන - ලකුණු 04 (තනිකඩ නිල නිවාසවල පදිංචිකරුවන් අදාළ කර නොගත යුතු ය.)
- ලියාපදිංචි නොකළ බදු ඔප්පුව - ලකුණු 02 (උපරිම ලකුණු 10)

III. පදිංචිය සනාථ කරන අතිරේක ලේඛන

එක් ලේඛනයක් සඳහා එක් ලකුණක් බැගින් ලකුණු 05
(ජාතික හැඳුනුම්පත/ විදුලි බිල්පත් / ජල බිල්පත්/ දුරකථන බිල්පත්/ විවාහ සහතිකය ආදිය) (උපරිම ලකුණු 05)

IV. පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව

පදිංචිය සනාථ වන්නේ නම් පමණක් දැනට පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්නයේ අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම් උපරිම ලකුණු ලබා දිය යුතු ය. ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්නයේ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න එක් පාසලක් වෙනුවෙන් ලකුණු 05 බැගින් අඩු කළ යුතු ය. (උපරිම ලකුණු 50)

(අදාළ දරුවාට ඇතුළත්වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ එම දරුවාට ඇතුළත් වීමට අවශ්‍ය මාධ්‍යය සහිත පාසලක් ද, තමන්ට අදාළ ගැහැනු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද, යන්න සහ අදාළ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ.)

යම් පාසලක් පදිංචි ස්ථානයට ආසන්න වුවත් එම පාසලට යාමට මාර්ග බාධා ඇත්නම් (උදා: ගංගා ආදිය) එම පාසල සඳහා ලකුණු අඩු නොකළ යුතු ය.

මෙම ගණය යටතේ පදිංචිය සනාථ නොවන්නේ නම් ලබා දුන් ලකුණු අවලංගු කළ හැකි ය.

6.2 තත් පාසලේ ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන් වන මව්පියන්ගේ දරුවන් - 25%

මේ ගණය යටතේ තත් පාසලේ ඉගෙනුම ලැබූ ආදි ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක වශයෙන් ළමයාගේ මව/ පියා/ නිත්‍යානුකූල භාරකරුට අයදුම් කළ හැකි ය. පහත සඳහන් ලකුණු ක්‍රමයට අනුව මේ ගණය යටතේ ලකුණු ලබා දිය යුතු ය:-

I. අයදුම්කරු පාසලේ අධ්‍යාපනය ලැබූ එක් පන්තියකට ලකුණු 02 බැගින් (උපරිම ලකුණු 26)

II. පාසල් කාලය තුළ අයදුම්කරු විසින් ලබා ගත් අධ්‍යාපන ජයග්‍රහණ (උපරිම ලකුණු 25)

III. පාසල් කාලය තුළ අයදුම්කරු විසින් විෂය සමගාමී කටයුතුවලින් ලබා ගත් ජයග්‍රහණ (උපරිම ලකුණු 25)

IV. ආදි ශිෂ්‍ය සංගම් සාමාජිකත්වය, පාසල් කාලයෙන් පසු ලබා ඇති අධ්‍යාපන ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා ලබා දුන් විවිධ ආකාරයේ සහයෝග
(මෙහි දී පාසලේ දියුණුව සඳහා ලබා දුන් විවිධ ආකාරයේ සහයෝගය සඳහා ලබා දිය යුත්තේ උපරිම ලකුණු 06ක් පමණි) (උපරිම ලකුණු 24)

සටහන. - II, III හා IV හි සඳහන් උපරිම ලකුණු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි චක්‍රලේඛ උපදෙස්වලට පටහැනි නොවන ආකාරයට බෙදා වෙන් කර ගත හැකි ය. මේ පිළිබඳ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති විසින් පාසලේ ලොග් පොතේ සටහනක් තැබිය යුතු අතර, තමාගේ වාර්තා පොතෙහි ද සටහන් කර තබා ගත යුතු ය.

6.3 එවකටත් තත් පාසලේ අධ්‍යාපනය ලබන සිසු/ සිසුවියන්ගේ සහෝදර සහෝදරියන් - *15%*
ළමයාගේ මව්පියන්ගේ/ නිත්‍යානුකූල භාරකරුගේ වැඩිමහල් ළමයින් දැනටමත් එම පාසලේ ඉගෙනුම ලබමින් සිටී නම් මෙම ගණය යටතේ අයදුම් කළ හැකි ය. පහත සඳහන් ලකුණු ක්‍රමයට අනුව මේ ගණය යටතේ ලකුණු ලබා දිය යුතු ය.

I. පාසලේ සිටින සහෝදර/ සහෝදරියන්

මේ සඳහා ලකුණු ලබා දීමේ දී පාසලේ ඉගෙනුම ලබන සහෝදර/ සහෝදරියන් සංඛ්‍යාව කොපමණ වුව ද ලකුණු ලබා දිය යුත්තේ ඉන් එක් අයකු සඳහා පමණි. එසේ ලකුණු ලබා දීමේ දී ඔහු/ ඇය එම පාසලේ ගත කළ එක් ශ්‍රේණියක් වෙනුවෙන් ලකුණු 03 බැගින් (උපරිම ලකුණු 30)

II. පදිංචිය

ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී ඇති බව සටහන් කිරීමට අයදුම්පතෙහි ලබා දී ඇති කොටස (අංක 06) සම්පූර්ණ කර ලියාපදිංචිය සනාථ කළ යුතු ය.

❖ ඡන්ද හිමි නාම ලේඛනයේ ඉල්ලුම්කරු හා ඉල්ලුම්කරුගේ කලත්‍රයාගේ නම හෝ නීත්‍යනුකූල භාරකරුගේ නම ලියාපදිංචි ව ඇත්නම් අයදුම් කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට ආසන්න වර්ෂ 05ක් සඳහා වර්ෂයකට ලකුණු 03ක් බැගින් ලකුණු 15

(පෙර වර්ෂවල ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිව සිටි ඉල්ලුම්කරු/ කලත්‍රයා විදේශගත ව සිටි නම් හෝ මිය ගොස් ඇත්නම් හෝ නීත්‍යනුකූලව දික්කසාද වී ඇත්නම් හෝ ලිපි ලේඛන සලකා බලා අදාළ ලකුණු ලබා දිය යුතු ය.)

❖ ඡන්ද හිමි නාම ලේඛනයේ ඉල්ලුම්කරුගේ හෝ කලත්‍රයාගේ නම පමණක් ලියාපදිංචි ව ඇත්නම් අයදුම් කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට ආසන්න වර්ෂ 05ක් සඳහා වර්ෂයකට ලකුණු 02 බැගින් ලකුණු 10 (උපරිම ලකුණු 15)

සැ.යු.- පදිංචිය සඳහා ලකුණු ලබා දෙන්නේ දැනට පදිංචි වී සිටින ස්ථානයේ ලිපි ලේඛන මගිනි. එහෙත් දැනට පදිංචි වී සිටින ස්ථානයේ පදිංචි වීමට පෙර පෝෂිත ප්‍රදේශය තුළ තවත් ස්ථානයක පදිංචි වී සිටි අයදුම්කරුවකු තම අවම වසර 05ක පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්දහිමි නාම ලේඛන ස්ථාන දෙකෙන්ම ඉදිරිපත් කරන විට පහත පරිදි කටයුතු කළ යුතු ය.

ඉල්ලුම්කරනු ලබන පාසලට වඩා ආසන්නයේ අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි පාසල් සඳහා අඩු කරනු ලබන ලකුණු නොවෙනස් වන්නේ නම් පමණක් ස්ථාන දෙකෙන්ම ඉදිරිපත් කර ඇති ඡන්දහිමි නාම ලේඛන දැනට පදිංචි ස්ථානයේ ඡන්දහිමි නාම ලේඛනය සේ සළකා ලකුණු ලබා දිය යුතු ය.

III. පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව

දැනට පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්නයේ තම දරුවාට ඇතුළත් වීමට හැකි, ප්‍රාථමික අංශය සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම් උපරිම ලකුණු ලබා දිය යුතු ය. ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්නයේ තම දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශය සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න එක් පාසලක් වෙනුවෙන් ලකුණු 05 බැගින් අඩු කළ යුතු ය.

(අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ එම දරුවාට ඇතුළත් වීමට අවශ්‍ය මාධ්‍යය සහිත පාසලක් ද, තමන්ට අදාළ ගැහැනු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද යන්න සහ අදාළ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ.) (උපරිම ලකුණු 35)

යම් පාසලක් පදිංචි ස්ථානයට ආසන්න වුවත් එම පාසලට යාමට මාර්ග බාධා ඇත්නම් (උදා: ගංගා ආදිය) එම පාසල සඳහා ලකුණු අඩු නොකළ යුතු ය.

IV. පදිංචිය තහවුරු කරන ලේඛන

අදාළ පුද්ගලයාගේ නමට පදිංචිය තහවුරු කරන ලේඛනය ලැබී වසර 05ක් හෝ ඊට වැඩි කාලයක් ගත වී ඇත්නම් සම්පූර්ණ ලකුණු ද, වසර 05ට අඩු හා වසර 03ක් හෝ ඊට වැඩි කාලයක් ගත වී ඇත්නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 75%ක් ද, වසර 03ට අඩු නම් 50%ක ලකුණු ප්‍රමාණයක් ද ලබා දිය යුතු ය.

- ඉල්ලුම්කරුගේ/ කලත්‍රයාගේ නමට පදිංචි ස්ථානයේ හිමිකම් ඔප්පුව ඇත්නම් (පැවරුම්/ තෑගි) - ලකුණු 10

- ඉල්ලුම්කරුගේ/ කලත්‍රයාගේ මවගේ හෝ පියාගේ නමට පදිංචි ස්ථානයේ හිමිකම් ඔප්පුව ඇත්නම් (පැවරුම්/ තෑගි) - ලකුණු 06(අනෙකුත් අයගේ නමට ඇත්නම් මෙම ලකුණු ලබා නොදිය යුතු ය. විහාර ගම් පනත යටතේ දෙනු ලබන ලියවිලි ආදිය ප්‍රදේශයට අනුව පිළිගත හැකි ය. තව ද පත්ඉරු හා දෙවන පිටපත් පරීක්ෂා කර තහවුරු කරගත හැකි ය.)

සැ.යු.- ඉල්ලුම්කරුගේ දෙමාපියන්ගේ නමට පදිංචි ස්ථානයේ අයිතිය තිබීමෙන් පසුව ඉල්ලුම්කරුගේ නමට අයිතිය ලබා දී ඇති අවස්ථාවක එසේ අයිතිය පැවරීමෙන් පසු ගත වී ඇති කාලය වසර 03ට වඩා අඩු වන්නේ නම් දෙමාපියන්ගේ නමට හිමිකම් ඔප්පුව තිබුනා සේ සලකා සම්පූර්ණ පදිංචි කාලය වසර 05 ට වැඩි වන්නේ නම් පමණක් ලකුණු 06ක් ලබා දිය යුතු ය.

- ලියාපදිංචි බදු ඔප්පුව/ රජයේ නිල නිවාස ලේඛනය/නීත්‍යානුකූලව පිළිගත හැකි අයිතිය තහවුරු කරන වෙනත් ලේඛන - ලකුණු 04 (තනිකඩ නිල නිවාසවල පදිංචිකරුවන් අදාළ කර නොගත යුතු ය.) (උපරිම ලකුණු *10*)

- ලියාපදිංචි නොකළ බදු ඔප්පුව - ලකුණු 02

V. පාසලේ සිටින සහෝදර/ සහෝදරියන් පාසලට ලබා දී ඇති ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා පාසලට ඇතුළත් වීමට බලාපොරොත්තු වන ළමයාගේ මව්පියන්/නීත්‍යානුකූල භාරකරුවන් විසින් පාසලට දක්වන ලද විවිධාකාර සහයෝග (උපරිම ලකුණු *10*)

(පාසලට දක්වන ලද විවිධාකාර සහයෝගය සඳහා ලබා දිය යුත්තේ උපරිම වශයෙන් ලකුණු 04ක් පමණි.)

6.4 අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ දරුවන් - *05 %*

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයේ ස්ථිර තනතුරක මව/ පියා/ නීත්‍යානුකූල භාරකරු නියුක්ත ව සිටී නම් පමණක් මෙම ගණයට ඉල්ලුම් කළ හැකි ය. පහත සඳහන් ලකුණු ක්‍රමයට අනුව මෙම ගණය යටතේ ලකුණු ලබා දිය යුතු ය. (මව/ පියා දෙදෙනා ම මෙම ගණය යටතේ සුදුසුකම් ලබන්නේ නම් ලකුණු වැඩියෙන් ලබා ගත හැකි තැනැත්තාගේ ලකුණු පමණක් සැලකිල්ලට ගත යුතු ය.)

I. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනයන්හි කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවකයකු ලෙස සේවා කාලය පූර්ණ වර්ෂයකට ලකුණු 01 බැගින් (උපරිම ලකුණු *20*)

II. වර්තමාන ස්ථිර පදිංචි ස්ථානයේ සිට වර්තමාන සේවා ස්ථානයට ඇති දුර

කි.මී. 100 ට වැඩි නම්	-	ලකුණු 35
කි.මී. 99 සිට කි.මී. 50 දක්වා	-	ලකුණු 25
කි.මී. 49 සිට කි.මී. 25 දක්වා	-	ලකුණු 15
කි.මී. 25 ට අඩු නම්	-	ලකුණු 05

(උපරිම ලකුණු *35*)

මෙම ලකුණු ලබා දිය යුත්තේ ස්ථිර පදිංචි ස්ථානයට අදාළ පෝෂිත ප්‍රදේශය තුළ ඇති පාසලකට ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවන්ට පමණි. (මෙහිදී ද පදිංචිය සනාථ කර ගත යුතු ය)

III. දුෂ්කර පාසල් සේවා කාලය (දුෂ්කර පාසලක් බව අදාළ කලාපයෙන් සහතික කළ යුතු ය.)

- ❖ දැනට දුෂ්කර පාසලක සේවයේ යෙදේ නම් දුෂ්කර සේවා කාලය - පූර්ණ වසරකට ලකුණු 05 බැගින් ලකුණු 25
- ❖ දැනට දුෂ්කර පාසලක සේවයේ නොයෙදෙන නමුත් මීට පෙර දුෂ්කර සේවයේ යෙදුණේ නම් සේවා කාලය - පූර්ණ වසරකට ලකුණු 03 බැගින් ලකුණු 15 (උපරිම ලකුණු *25*)

සැ.යු.- (අවම වශයෙන් වසරකට වඩා වැඩි දුෂ්කර සේවා කාලයක් සපුරා ඇති අයට පමණක් පූර්ණ වසරකට වඩා වැඩි වන මාස 06ක් හෝ ඊට වැඩි වන මාස ගණනට අදාල ලකුණෙන් භාගයක් ලබා දිය යුතුය)

IV. ලබා නොගත් නිවාඩු

ඉල්ලුම්පත් භාර ගන්නා වර්ෂයට පෙර වසර 05ක් සඳහා ලිත් වර්ෂය තුළ ලබා නොගත් නිවාඩු දින 20 ට ලකුණු 02 බැගින් (උපරිම ලකුණු 10)

වර්ෂයකට ලබා නොගත් නිවාඩු දින 20 ට වඩා අඩු නම් ලකුණු ලබා නොදිය යුතු ය. මෙහිදී ප්‍රසූත නිවාඩුවෙන් පසු ලබා ගන්නා අඩ වැටුප් නිවාඩු, වැටුප් රහිත නිවාඩු, ලබා තිබේ නම් පුද්ගලයකුට හිමි සාමාන්‍ය නිවාඩුවලින් (අනියම් හා අසනීප/ විවේක) එය අඩු කල යුතු ය.

V. දරුවා ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන පාසලේ ම සේවයේ යෙදෙන්නේ නම්,
(අ) සේවා කාලය අවු.03 හෝ ඊට වැඩි නම් ලකුණු 10
(ආ) සේවා කාලය අවු.03ට අඩු නම් ලකුණු 05 (උපරිම ලකුණු 10)

6.5 රජයේ අවශ්‍යතා මත ස්ථාන මාරු වීම් ලැබූ රාජ්‍ය/ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු නිලධරයන්ගේ දරුවන් - *04%*

මෙම ගණය යටතේ රජයේ/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු නිලධරයකුගේ ඉල්ලීම මත නොව රජයේ/ ආයතනයේ අවශ්‍යතා මත අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙරාතුව වූ වසර 05ක කාලයක් තුළ පාසල පිහිටි ප්‍රදේශය තුළ ස්ථාපිත ආයතනයකට ස්ථාන මාරු වීම් ලබා පැමිණ, පාසල පිහිටි ප්‍රදේශය තුළ දරුවා ඉල්ලුම්කරු සමග පදිංචි වී සිටින්නේ නම් පමණක් ඉල්ලුම් කළ හැකි ය. පහත සඳහන් ලකුණු ක්‍රමයට අනුව මෙම ගණය යටතේ ලකුණු ලබා දිය යුතු ය.

I. පෙර සේවා ස්ථානයේ සිට ස්ථාන මාරුවීම් ලබා පැමිණ ඇති නව සේවා ස්ථානය අතර දුර
කි.මී. 100 ට වැඩි නම් - ලකුණු *40*
කි.මී. 99 සිට කි.මී. 50 දක්වා - ලකුණු *30*
කි.මී. 49 සිට කි.මී. 25 දක්වා - ලකුණු *20*
කි.මී. 25 ට අඩු නම් - ලකුණු *10* (උපරිම ලකුණු *40*)

II. ස්ථාන මාරු වීම් ලැබ පැමිණ පදිංචි වූ ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව (පදිංචිය සනාථ කර ගත යුතු ය.)

දැනට පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්නයේ අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම් උපරිම ලකුණු ලබා දිය යුතු ය. ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්නයේ තම දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශය සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න පාසලක් වෙනුවෙන් ලකුණු 05 බැගින් අඩු කළ යුතු ය. (උපරිම ලකුණු *35*)

(අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ එම දරුවාට ඇතුළත් වීමට අවශ්‍ය මාධ්‍යය සහිත පාසලක් ද, තමන්ට අදාළ ගැහැනු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද යන්න සහ අදාළ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ.)

යම් පාසලක් පදිංචි ස්ථානයට ආසන්න වුවත් එම පාසලට යාමට මාර්ග බාධා ඇත්නම් (උදා: ගංගා ආදිය) එම පාසල සඳහා ලකුණු අඩු නොකළ යුතු ය.

III. රාජ්‍ය/ සංස්ථා/ රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු සේවකයකු ලෙස සේවා කාලය - (වසරකට එක් ලකුණක් බැගින් උපරිම ලකුණු 10) (උපරිම ලකුණු *10*)

IV. ස්ථාන මාරුවීම් ලැබ ගත වූ කාලය (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට)
වර්ෂයක කාලයක් තුළ නම් - ලකුණු 05
වර්ෂ 01 - 02 කාලයක් තුළ නම් - ලකුණු 04
වර්ෂ 02 - 03 කාලයක් තුළ නම් - ලකුණු 03
වර්ෂ 03 - 04 කාලයක් තුළ නම් - ලකුණු 02
වර්ෂ 04 - 05 කාලයක් තුළ නම් - ලකුණු 01 (උපරිම ලකුණු 05)

V. ලබා නොගත් නිවාඩු

ඉල්ලුම්පත් භාර ගන්නා වර්ෂයට පෙර වසර 05ක් සඳහා මිත් වර්ෂය තුළ ලබා නොගත් නිවාඩු දින 20 ට ලකුණු 02 බැගින් (උපරිම ලකුණු 10)

වර්ෂයකට ලබා නොගත් නිවාඩු දින 20 ට වඩා අඩු නම් ලකුණු ලබා නොදිය යුතු ය. මෙහිදී ප්‍රසූත නිවාඩුවෙන් පසු ලබා ගන්නා අඩ වැටුප් නිවාඩු, වැටුප් රහිත නිවාඩු, ලබා තිබේ නම් පුද්ගලයකුට හිමි සාමාන්‍ය නිවාඩුවලින් (අනියම් හා අසනීප/ විවේක) එය අඩු කල යුතු ය.

සැ.යු.- පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට පසු හෝ පළමු ශ්‍රේණිය ආරම්භ වීමෙන් පසු හෝ රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම් ලැබ/ අදාළ දරුවා සමඟ විදේශගත ව සිට පැමිණෙන නිලධරයන්ගේ දරුවන්ට පාසල් ලබා දීම සඳහා අදාළ පාසල අයත් වන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට ඔවුන් විසින් ඉල්ලුම්පත් යොමු කළ යුතු ය. මෙම මව්පියන්ගේ දරුවන් සඳහා අදාළ අධ්‍යාපන බලධාරීන් විසින් තීරණය කරන ලද පාසල් ලබා දෙනු ඇත. මේ අය සඳහා ද ඉහත ලකුණු ක්‍රමය අදාළ කරගත හැකි ය.

6.6 ළමයා සමඟ විදේශගතව සිට පැමිණෙන තැනැත්තන්ගේ දරුවන් - 01 %

මෙම ගණය යටතේ ඉල්ලුම්පත් භාරගන්නා වර්ෂයට පෙර වර්ෂයේ ජූලි 01 වන දින සිට ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දින දක්වා කාලය තුළ ළමයා සමඟ විදේශගතව සිට පැමිණෙන මව/ පියා/ නීත්‍යනුකූල භාරකරුට ඉල්ලුම් කළ හැකි ය. පහත සඳහන් ලකුණු ක්‍රමයට අනුව මෙම ගණය යටතේ ලකුණු ලබා දිය යුතු ය.

I. දිවයිනට පැමිණි දිනයේ සිට ඊට පෙර විදේශ ගත වී සිටි කාලය
අඛණ්ඩව වසර 03ක් හෝ ඊට වැඩි කාලයක් ලකුණු 25
අඛණ්ඩව වසර 02 සිට වසර 03ක් දක්වා ලකුණු 15
අඛණ්ඩව වසර 01 සිට වසර 02 දක්වා, ලකුණු 10 (උපරිම ලකුණු 25)

II. විදේශගත වූ ස්වභාවය
ශ්‍රී ලංකා දූත මණ්ඩල රාජකාරී සඳහා ලකුණු 40
ශ්‍රී ලංකා රජයේ අවශ්‍යතා සඳහා ලකුණු 30
(රජය මඟින් හෝ රජය වෙනුවෙන් විදේශයක රාජකාරියක් ඉටු කිරීම සඳහා පත් කළ පුද්ගලයන් සඳහා)
ශිෂ්‍යත්වයක් සඳහා ලකුණු 20
පෞද්ගලික අවශ්‍යතාවක් සඳහා ලකුණු 10 (උපරිම ලකුණු 40)

III. දැනට පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව (පදිංචිය සනාථ කර ගත යුතු ය.)
පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්නයේ අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම් උපරිම ලකුණු ලබා දිය යුතු ය. ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්නයේ අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශය සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න පාසලක් වෙනුවෙන් ලකුණු 05 බැගින් අඩු කළ යුතු ය. (උපරිම ලකුණු 35)

(අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ එම දරුවාට ඇතුළත් වීමට අවශ්‍ය මාධ්‍යය සහිත පාසලක් ද, තමන්ට අදාළ ගැහැනු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද යන්න සහ අදාළ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ.)

යම් පාසලක් පදිංචි ස්ථානයට ආසන්න වුවත් එම පාසලට යාමට මාර්ග බාධා ඇත්නම් (උදා: ගංගා ආදිය) එම පාසල සඳහා ලකුණු අඩු නොකළ යුතු ය..

7.0 අයදුම්පත් ලැබීමෙන් පසු ක්‍රියා පිළිවෙළ

7.1. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසු ව, සියලු ම අයදුම්පත් විදුහල්පතිවරයාගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ පැහැදිලි ලෙස ලේඛනගත කළ යුතු ය. මෙහි දී ඉහත 6.1 සිට 6.6 දක්වා ගණ අනුව වර්ගීකරණය කළ යුතු ය.

7.2. මෙහි දී ලැබූ අයදුම්පත් අංක කර සී.ආර්. පොතක ඒ ඒ ගණයට වෙන් කරන ලද පිටුවල අනු අංක සහිත ව ලේඛනගත කළ යුතු ය. මේ සඳහා පොතෙහි එක යාව පිහිටි පිටු 02ක් සම්බන්ධ වන සේ යෙදිය හැකි වන අතර, පහත සඳහන් ආකෘතිය ඒ සඳහා භාවිතා කළ යුතු ය. මේ ලේඛනගත කිරීම පරිගණකය මගින් සිදු කරන්නේ නම් මූලික තොරතුරු පමණක් පරිගණකගත කළ යුතු අතර, අනෙකුත් තොරතුරු එනම් ලබා ගත් ලකුණු හා විශේෂ සටහන් පරිගණක මුද්‍රිත පිටපතෙහි අතින් සටහන් කළ යුතු ය.

ගණය – ....

අනු. අංකය	ළමයාගේ නම	උපන් දිනය	ස්ත්‍රී/ පුරුෂ භාවය	මව/පියා/ භාරකරුගේ නම	ලිපිනය	ලබා ගත් ලකුණු	විශේෂ සටහන්

7.3 ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටින/ සිටි ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයන්ගේ දරුවන් ඉහත 6.0 (අ) හි සඳහන් ගණ යටතේ ඔවුන්ට අදාළ සුදුසුකම් තිබේ නම් ක්‍රියාන්විතය සඳහා ලබා දෙන විශේෂ අනුග්‍රහය ගැන නොසලකා කටයුතු කළ යුතු ය.

7.4 සියලු ගණ සඳහා ලකුණු ලබා දීමේ ක්‍රම හඳුන්වා දී ඇති නිසා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් එක් එක් ගණය සඳහා වෙන වෙන ම ඉදිරිපත් කරන ලේඛනවල අඩංගු අවශ්‍ය විස්තර සටහන් කර ගැනීමටත් ලකුණු ලබා දීමටත් ලකුණු ක්‍රමයට අනුකූල වන පරිදි ලකුණු ලබා දීමේ පත්‍රිකා සකස් කර ගැනීමටත් කටයුතු කළ යුතු ය.

8.0 තෝරා ගැනීමේ ප්‍රථම සම්මුඛ පරීක්ෂණය

8.1 සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් තෝරා ගැනීම

(අ) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්පත් පරීක්ෂා කිරීමට පෙර පාසලේ ආගමික ප්‍රතිශතය (ඇත්නම් පමණක්) අංක 3.2 අනුව බෙදා ගැනීමෙන් පසුව එක් එක් ගණය යටතේ ලැබී ඇති අයදුම්පත් ආගම අනුව වෙන් කර ගත යුතු ය. (ගණ අනුව සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේ දී ද, ආගම අනුව වෙන වෙන ම කැඳවා පරීක්ෂා කළ යුතු අතර ළමයින්ගේ තේරීම් ලැයිස්තුව නිකුත් කිරීමේ දී ද එක් එක් ගණ යටතේ එක් එක් ආගම්වලට හිමි ළමයින් සංඛ්‍යාව අනුව ළමයින්ගේ නාම ලේඛනය වෙන් වෙන් ව දැක්විය යුතු ය.)

(ආ) අයදුම්පත් ලැබී ලේඛනගත කිරීමෙන් පසු ව, සම්මුඛ පරීක්ෂණ මණ්ඩල විසින් අයදුම්පත්වල සඳහන් තොරතුරු පරීක්ෂා කර අයදුම්පත්වල ලකුණු සටහන් කළ යුතු ය එසේ ලබා දෙන ලකුණු අනුව ප්‍රමුඛතා ලේඛන සකස් කර එම ලේඛනයේ ඉහළ සිටින, සම්මුඛ පරීක්ෂණය මගින් ඇතුළත් කළ හැකි සංඛ්‍යාව මෙන් සිව් ගුණයක් වන සේ සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසු අයගේ නාම ලේඛනයක් පිළියෙල කර ගත යුතු ය. පුරප්පාඩු සංඛ්‍යාව මෙන් සිව් ගුණයට අඩුවෙන් අයදුම්පත් ලැබී ඇති අවස්ථාවල දී අයදුම් කළ සියලු දෙනා ම සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබයි.

(ඇ) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සමග සාකච්ඡා කර දින තීරණය කිරීමෙන් අනතුරු ව විදුහල්පති විසින් අදාළ මව්පියන්/ නිත්‍යනුකූල භාරකරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවිය යුතු ය. කැඳවීම් ලිපි පාසලේ ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව සහිත ව සති දෙකකටවත් පෙර අදාළ මව/ පියා/ නිත්‍යනුකූල භාරකරුට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය. එසේ ම සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දින පිළිබඳ විස්තර කල් ඇති ව පාසලේ උදෑසන රැස්වීමේ දී ප්‍රකාශ කිරීමෙන් හා දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීමෙන් ප්‍රසිද්ධ කළ යුතු ය.

(ඇ) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉල්ලුම් පත්‍ර පරීක්ෂා කර ලකුණු ලබා දීමෙන් පසු ව ලකුණු ප්‍රමුඛතා අනුව සකස් කරගනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව මෙන් සිව් ගුණය ඇතුළත් ලේඛනයේ නොසිටින අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා නොකැඳවිය යුතු ය. එහෙත් සම්මුඛ පරීක්ෂණ ආරම්භ කිරීමට පෙර, ඔවුන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබීමට හේතු පැහැදිලි ව සඳහන් කරන ලද ලිපියක් අදාළ අයදුම්කරුවන් වෙත විදුහල්පති විසින් යැවිය යුතු ය.

8.2 (අ) සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී චක්‍රලේඛයේ සඳහන් ලකුණු ක්‍රමයට අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම් පත්‍රයෙහි ලබා දී ඇති ලකුණු ලිපි ලේඛන මගින් සනාථ කර ගත යුතු ය. මෙහිදී 7.4 හි සඳහන් පරිදි සකස් කර ගත් ලකුණු ලබා දීමේ පත්‍රිකාවෙහි මව්පියන්/ නිත්‍යානුකූල භාරකරු අභිමුඛයේ දී ලකුණු ලබා දී එම පත්‍රිකාවෙහි ම එම ලකුණට එකඟ වන බවටත් වැරදි තොරතුරු, කූට ලේඛන ලබා දී ඇති බව තහවුරු වුවහොත් ලකුණු සංශෝධනය වීමට/ අහෝසි වීමට ඉඩ ඇති බව තමන් දැන සිටින බවටත් ඔවුන්ගේ අත්සන ලබා ගත යුතු ය. ඉල්ලුම්කරුවෙක් ගණ කිහිපයකට ඉල්ලුම් කරනු ලබන අවස්ථාවේ දී ඉල්ලුම් කල සෑම ගණයක් සඳහාම සුදුසුකම් පරීක්ෂා කල යුතු ය.

(ආ) මව්පියන්/නිත්‍යනුකූල භාරකරු විසින් ඉදිරිපත් කරනු ලබන ඡන්ද හිමි නාමලේඛනවල ලියාපදිංචි විස්තර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවලට ලබා දී ඇති ඡන්ද හිමි නාම ලේඛන හෝ මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා සංයුක්ත තැටි (CD) මගින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සනාථ කර ගත යුතු ය.

(ඇ) ඡන්ද හිමි නාමලේඛනයෙහි ලියාපදිංචිය පිළිබඳ ව යම් ගැටලුවක් මතුවන අවස්ථාවල දී මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් එය සනාථ කර ගත යුතු ය.

(ඈ) මෙහිදී මව්පියන්/ නිත්‍යනුකූල භාරකරුවන් විසින් ළමයාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත ද ඉදිරිපත් කර ඇති විස්තර සනාථ කර ගැනීම සඳහා අදාළ වන සියලු ලිපි ලේඛනවල මුල් පිටපත් ද ඉදිරිපත් කළ යුතු ය. මීට අමතර ව එම ලේඛනවල ඡායා පිටපත් ද ලබා ගත යුතු ය.

(ඉ) මව්පියන්/ නිත්‍යනුකූල භාරකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛනවල නිරවද්‍යතාව, දිව්රුම් පෙත්සමක් ලබා ගැනීමෙන් සහතික කර ගත යුතු ය.

(ඊ) එසේ වුව ද ඉදිරිපත් කරන ලද යම් ලේඛනයක් කූට ලේඛනයක් යැයි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හැඟී යන්නේ නම්, එය නිකුත් කර ඇති ආයතනයෙන් හෝ බලධාරියාගෙන් විමසීමක් කොට එහි සත්‍ය අසත්‍යතාව තහවුරු කර ගැනීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිට බලය ඇත. එවැනි අවස්ථා ඇති වූ කල්හි ඒ පිළිබඳ ව අදාළ බලධාරියාට සුදුසු පරිදි කටයුතු කිරීමට දන්වා සිටිය හැකි ය. ඒ අනුව ඉදිරිපත් කර ඇති ලේඛනයක්/ලේඛන කූට ලේඛනයක්/ලේඛන යයි සනාථ වන්නේ නම් එවැනි ලේඛනයක්/ලේඛන ඉදිරිපත් කිරීමට විරුද්ධ ව නිත්‍යනුකූල ව කටයුතු කිරීමට පියවර ගත යුතු ය.

8.3 (අ) ප්‍රථම සම්මුඛ පරීක්ෂණයෙන් පසු ව අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණු අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් එක් එක් ගණ සඳහා වෙන වෙන ම ලකුණු ප්‍රමුඛතා ලැයිස්තු පිළියෙල කළ යුතු ය. මේ ලැයිස්තුව අනුසාරයෙන් පාසලට ඇතුළත් කිරීම සඳහා ලකුණු ප්‍රමුඛතා අනුව තාවකාලික ව තෝරා ගන්නා ළමයින්ගේ තාවකාලික ලැයිස්තුවක් පිළියෙල කළ යුතු ය. මෙහි දී සමාන්තර පන්තියකට තෝරා ගත හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 30කි. තාවකාලික ලැයිස්තුවට අමතර ව ලකුණු ප්‍රමුඛතා අනුව එක් එක් ගණයකින් වෙන වෙන ම පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 25%ක් වන සේ පොරොත්තු ලේඛනයක් ද සකස් කළ යුතු ය.

(ආ) තාවකාලික ලැයිස්තුව පහත දක්වා ඇති ආකෘතියට අනුකූල විය යුතු ය. තාවකාලික ලැයිස්තුව සකස් කිරීමේ දී පාසලේ පුරප්පාඩු සංඛ්‍යාව අනුව ලකුණු අනුපිළිවෙළට එක් එක් ගණය වෙන වෙන ම සඳහන් කළ යුතු ය. මේ අයුරින් ම පොරොත්තු ලේඛනය ද සකස් විය යුතු ය.

ගණය : ....

පුරප්පාඩු සංඛ්‍යාව : ....

අනුක්‍රමික අංකය	ළමයාගේ නම	මවගේ/ පියාගේ හෝ නීත්‍යනුකූල භාරකරුගේ නම	ලිපිනය	ලබා ගත් ලකුණු	විශේෂ සටහන්

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය :

නම අත්සන

1.
2.
3.
4.
5.

(ඇ) තාවකාලික ලැයිස්තුව හා පොරොත්තු ලේඛන ප්‍රසිද්ධ කිරීමට පෙර පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ ඉහත ලේඛනවල නම් සඳහන් ළමයින්ගේ පදිංචිය, ස්ථානීය පරීක්ෂණ මගින් තහවුරු කර ගත යුතු ය. ස්ථානීය පරීක්ෂණයේ දී පදිංචිය තහවුරු නොවේ නම් ලේඛනයෙන් ඉවත් කොට අභියාචනා හා විරෝධතා පරීක්ෂණ සඳහා කැඳවිය යුතු ය. අවශ්‍ය වන්නේ නම් අනෙකුත් ගණ සඳහා ද ස්ථානීය පරීක්ෂණ කළ හැකි ය. (යම් පුද්ගලයකු පදිංචි බව හෝ පදිංචි නොවන බව පසුකාලීන ව සනාථ කිරීමට අවශ්‍ය වුවහොත් එය සනාථ කිරීමට හැකි වන පරිදි ස්ථානීය පරීක්ෂණ පිළිබඳ සියලු තොරතුරු සමග වාර්තා සකස් කොට තබා ගත යුතු ය.)

(ඈ) ගණ කිහිපයකට ඉල්ලුම් කළ ළමයකු ගණ කිහිපයකට තේරී ඇති අවස්ථාවක දී එම ළමයාගේ නම වැඩි ම ප්‍රතිශතයක් ඇති ගණය යටතේ පමණක් ඉතිරි කර අනෙකුත් ගණවල ලැයිස්තුවෙන් ඉවත් කළ යුතු ය.

(ඉ) ඉහත සඳහන් පරිදි සකස් කරන ලද තාවකාලික ලේඛනයේ හා පොරොත්තු ලේඛනයේ පිටපත් 04ක් ලබා ගෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියලු ම සාමාජිකයන් සියලු ම පිටුවල අත්සන් කිරීමෙන් අනතුරු ව විදුහල්පති භාර ගත යුතු ය. ඉන් අනතුරු ව විදුහල්පති විසින් ජාතික පාසලක් නම් ජාතික පාසල් සම්බන්ධීකරණ අධ්‍යාපන අධ්‍යක්ෂට එක් පිටපතක් ද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට එක් පිටපතක් ද පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට එක් පිටපතක් බැගින් ද ලබා දිය යුතු ය. තෙවන පිටපත පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය. හතර වන පිටපත පාසල් ගොනුවේ ගොනු කිරීම ද කළ යුතු ය. මීට අමතර ව පළාත් පාසලක් නම් තවත් පිටපතක් ලබා ගෙන පළාත් අධ්‍යාපන ලේකම් වෙත ද එවිය යුතු ය.

(ඊ) දැන්වීම් පුවරුවේ යොදන තාවකාලික ලැයිස්තුව හා පොරොත්තු ලේඛනය සති දෙකක්වත් අඛණ්ඩ ව ප්‍රදර්ශනය කළ යුතු ය. තාවකාලික ලැයිස්තුව හා පොරොත්තු ලේඛනය අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අත්සන් නොමැති ව ප්‍රසිද්ධ කිරීම නොකළ යුතු ය.

9.0 අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කිරීම

9.1 තාවකාලික ලැයිස්තුව හා පොරොත්තු ලේඛන පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කර සති 02ක් ඉකුත් වීමට පෙර ලේඛනවල යම් ස්ථානයක නුසුදුසු ළමයකුගේ නම අඩංගු වී ඇත්නම් ඒ පිළිබඳ විරෝධතාව හා/ හෝ සුදුසුකම් තිබිය දීත් තම දරුවාගේ නම නුසුදුසු තැනක ඇත්නම් ඒ පිළිබඳ ව අභියාචනයක් විදුහල්පති වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු ය. ඒ සමග තම නම සහ ලිපිනය සඳහන් ලියාපදිංචි තැපැල සඳහා අවශ්‍ය මුද්දර සහිත ලියුම් කවරයක් ද එවිය යුතු ය. මෙම කාල සීමාවෙන් පසු ව ඉදිරිපත් කරනු ලබන කිසිදු අභියාචනයක් හෝ විරෝධතාවයක් සලකා බලනු නො ලැබේ.

9.2 (අ) විදුහල්පතිගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ සියලු ම විරෝධතා ලිපි වෙන වෙන ම අංක කර, පහත සඳහන් ආකෘතියට අනුව ලේඛනගත කිරීමේ වගකීම ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයකු නොවූ විදුහලේ නියෝජ්‍ය විදුහල්පතිවරයකුට පැවරිය යුතු ය. නිර්නාමික ව විරෝධතා දක්වන ලිපි ද මේ ලේඛනයට ඇතුළත් කළ යුතු වේ.

අනු අංකය	*විරෝධතාවට ලක්වූ දරුවාගේ නම*	*එම දරුවාගේ කැඳවීම් අංකය*	*එම දරුවාගේ මව/පියා/භාරකරුගේ නම හා ලිපිනය*	*ලිපි අංකය*	*දැක්වූ විරෝධතාව කෙටියෙන්*

මෙම ලේඛනය රහසිගත ව තබා ගත යුතු වේ.

(ආ) මීට අමතර ව අභියාචනා ඉදිරිපත් කළ අයගේ ලේඛනයක් ද ඉහත 9.2 "අ" හි සඳහන් කරන ලද නියෝජ්‍ය විදුහල්පති විසින් සුදුසු අයුරින් සකස් කර ගත යුතු ය.

9.3 (අ) සියලු ම විරෝධතා හා අභියාචනා ලේඛනගත කර, අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කිරීමට ලබා දී ඇති දෙසතියක කාල සීමාව ඉකුත් වීමෙන් පසු දින දහයක් ඇතුළත විරෝධතාවලට ලක් වූ ළමයින්ගේ සංඛ්‍යාව හා අභියාචනා ඉදිරිපත් කර ඇති සංඛ්‍යාව පළාත් පාසලක් නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද ජාතික පාසලක් නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් සම්බන්ධීකරණ අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද විදුහල්පති විසින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(ආ) ලේඛනගත ඉහත සඳහන් විරෝධතා ලේඛනය හා අභියාචනා ලේඛනය අනුව, මුලික සම්මුඛ පරීක්ෂණයට උපයෝගී කර ගත් ලේඛනයේ (සී.ආර්.පොත/ පරිගණක මුද්‍රිත ලේඛන) අදාළ නම් යටින් එක් වර්ණයකින් ඉරි ඇඳීම හෝ ඉස්මතු කිරීමෙන් (Highlight) විරෝධතාවට ලක් වන බව දැක්විය යුතු අතර, අභියාචනා ඉදිරිපත් කළ අයගේ නම් වෙනත් වර්ණයකින් ඉරි ඇඳීම හෝ ඉස්මතු කර දැක්වීම කළ යුතු ය.

10.0 අභියාචනා හා විරෝධතා පරීක්ෂණ

10.1 පාසල වෙත ලැබු අභියාචනා හා විරෝධතා විධිමත් ව පරීක්ෂා කොට තීරණයක් ගැනීම සඳහා අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ගත යුතු ය. මේ මණ්ඩලය ජාතික පාසල් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් සම්බන්ධීකරණ අධ්‍යාපන අධ්‍යක්ෂ/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත් කළ යුතු අතර, පළාත් පාසල් සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත් කළ යුතු ය.

10.2 අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සංයුතිය පහත සඳහන් පරිදි විය යුතු ය:-

(අ) පාසල් වර්ගීකරණයට අනුව සමාන මට්ටමේ පාසලක විදුහල්පතිවරයෙක් (සභාපති) (පාසල් දෙකක විදුහල්පතිවරුන් එම පාසල් දෙකට මාරු කර පත් කිරීම නොකළ යුතු ය.)

(ආ) අදාළ පාසලේ ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම් (ලේකම්)

(ඇ) අදාළ පාසලේ වසරකට වැඩි සේවා කාලයක් සහිත පළමු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට සහභාගි නොවූ නියෝජ්‍ය/ සහකාර විදුහල්පති/ අංශ ප්‍රධානි/ ජ්‍යෙෂ්ඨ ගුරුවරයෙක්

(ඈ) පාසල් නගා සිටුවීමේ පාසල් සංවර්ධන කමිටු/ පාසලේ සංවර්ධන සමිතියේ නියෝජිතයෙක් (එම පාසලේ ආදි ශිෂ්‍යයෙක් හෝ ගුරුවරයෙක් නොවිය යුතු ය.)

(ඉ) ආදි ශිෂ්‍ය නියෝජිතයෙක්.

10.3 ඉහත සඳහන් අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් අතරින් ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම් හැර අනෙකුත් සියලු සාමාජිකයන් අදාළ පාසලේ ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නොසිටි අය විය යුතු ය. ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම් ලෙස කටයුතු කළ පුද්ගලයා අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ ද ලේකම් ලෙසට කටයුතු කළ යුතු ය.

10.4 මීට අමතරව 10.1 හි සඳහන් පත් කිරීමේ බලධරයා විසින් මෙම අභියාචනා හා විරෝධතා පරීක්ෂණ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධරයෙක් පත් කර ගත යුතු ය.

10.5 නිරීක්ෂණය කරනු ලබන නිලධරයා අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයට සම්බන්ධ නොවන අතර, මෙම කටයුතු නිරීක්ෂණය කර අවශ්‍ය උපදෙස් ලබා දෙනු ඇත. තව ද අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයට අවශ්‍ය වන්නේ නම් මෙම නිරීක්ෂකයාගෙන් උපදෙස් ලබා ගැනීමට ද හැකි ය.

10.6 විරෝධතා විභාග කිරීමේ දී විරෝධතාවලට ලක්වූ ළමයාගේ මව්පියන්/නීත්‍යානුකූල භාරකරුවන් විසින් ඉදිරිපත් කර ඇති ලිපි ලේඛන පමණක් (ප්‍රථම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ) නැවත වරක් විමර්ශනය කරන අතර, විරෝධතාව දැක් වූ අය කැඳවා විරෝධතාවෙහි නිරවද්‍යතාව විමර්ශනයට ලක්කළ යුතු ය. ඉන්පසු විරෝධතාවට ලක් වූ ළමයාගේ මව්පියන්/ නීත්‍යානුකූල භාරකරුවන් ද කැඳවා පරීක්ෂා කර තීරණයකට එළඹීම අවශ්‍ය වේ. විරෝධතාව දැක්වූ මව්පියන්/ නීත්‍යානුකූල භාරකරුවන් හා විරෝධතාවයට ලක්වූ දරුවන්ගේ මව්පියන්/ නීත්‍යානුකූල භාරකරුවන් වෙන වෙන ම කැඳවිය යුතු ය. ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ දී භාවිත කළ සී.ආර්.පොතෙහි/ පරිගණක මුද්‍රිත ලේඛනයෙහි විශේෂ සටහන් තීරුවේ මේ පිළිබඳ විස්තර හා තීරණ රතු පාටින් ලියා දැක්විය යුතු අතර, විරෝධතා පරීක්ෂණය සම්බන්ධව වෙනම වාර්තාවක් ද තබා ගත යුතු යි.

10.7 අභියාචනා විභාග කිරීමේ දී අභියාචනා ඉදිරිපත් කළ සියලු ම දෙනා කැඳවා සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ ලිපි ලේඛන පමණක් නැවත වරක් විමර්ශනය කළ යුතුය. මෙහිදී ගනු ලබන තීරණ හා අදාළ විස්තර ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ දී උපයෝගී කරගත් සී.ආර පොතෙහි/ පරිගණක මුද්‍රිත ලේඛනයෙහි රතු පාටින් විශේෂ සටහන් තීරුවේ ලියා දැක්විය යුතු අතර, වෙනම වාර්තාවක් ද තබා ගත යුතු ය.

10.8 අභියාචනා හා විරෝධතා විභාග කිරීමේ කටයුතු විවෘත ව හා විනිවිද භාවයෙන් යුක්තව පැවැත්විය යුතු අතර, කමිටුවට යම් කරුණක් පිළිබඳව සනාථ කර ගැනීමට (ස්ථානීය පරීක්ෂණය ඇතුළුව) අවශ්‍ය අවස්ථාවල ඊට අදාළ විවිධ පියවර ගත හැකි ය.

10.9 කුමන තත්ත්වයක් යටතේ වුව ද අභියාචනා හා විරෝධතා පරීක්ෂණයට කැඳවීම හා සංවිධාන කටයුතු විදුහල්පති විසින් කළ යුතු වන්නේ ය.

11.0 අවසාන ලැයිස්තුව

11.1 (අ) අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් අභියාචනා හා විරෝධතා පරීක්ෂා කිරීමෙන් පසු අවසාන ලැයිස්තුව සැකසිය යුතු ය. මෙහි දී සුදුසුකම් අනුව තාවකාලික ලැයිස්තුවේ නිසි තැනට අභියාචනාකරුවන් හා විරෝධතාවට ලක්වූ/දැක්වූ අය ඇතුළත් කොට නැවත සංශෝධිත තාවකාලික ලේඛනය සකස් කළ යුතු ය. ඒ අයුරින් ම පොරොත්තු ලේඛනය ද සංශෝධනය කළ යුතු ය.

(ආ) ඉහත පරිදි සකස් කිරීමේ දී අභියාචනා හා විරෝධතාවලින් සුදුසුකම් ලබා තාවකාලික ලැයිස්තුවේ නිසි තැන්වලට ළමයින් ඇතුළත් වන අවස්ථාවේ දී තාවකාලික ලැයිස්තුවේ අවසානයට සිටින ළමයින් ලැයිස්තුවෙන් ඉවත් වීමට ඉඩ ඇත. එවැනි ළමයින්ගේ මව්පියන් නැවත අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් කැඳවා ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් පසුව අවසාන තීරණයකට එළඹිය යුතු ය.

11.2 සංශෝධිත තාවකාලික ලේඛනයේ සිටින ළමයින්ගෙන් ලකුණු ප්‍රමුඛතා අනුව අවශ්‍ය සංඛ්‍යාව තෝරා ගෙන අවසාන ලැයිස්තුව සැකසිය යුතු ය. තෝරා ගත් ළමයින් 30 දෙනාට අමතරව තවත් ළමයින් තිදෙනෙකු අභියාචනා හා විරෝධතා පරීක්ෂණයෙන්ද තෝරා ගත හැකි ය. එනම් **අවසාන ලැයිස්තුවේ සමාන්තර පන්තියක් සඳහා ළමයින් 33 දෙනකු තෝරා ගත යුතු ය.**

11.3 (අ) දැන්වීම් පුවරුවේ අවසන් ලේඛනය ප්‍රදර්ශනය කිරීමට පෙර එක ම දරුවාගේ නම පාසල් කිහිපයක තිබීම වැළැක්වීම සඳහා අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් කැඳවිය යුතු ය. එම රැස්වීම සඳහා එසේ සිදුවී ඇතැයි සිතන පාසල්වල විදුහල්පතිවරුන් කැඳවිය යුතු ය.

(ආ) එම රැස්වීමේදී අදාළ පාසල්වල අවසන් ලේඛනය මගින් එක ම ළමයාගේ නම පාසල් කිහිපයක ම තිබෙනවා ද යන්න සොයා බලා එම ළමයින්ගේ ලේඛනයක් සකසා ගත යුතු ය. පසු ව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා අදාළ විදුහල්පතිවරුන් විසින් අයදුම්පතෙහි මව්පියන්/ නීත්‍යානුකූල භාරකරුවන් විසින් ඉල්ලා ඇති පාසල් ප්‍රමුඛතා අනුව පහළ ප්‍රමුඛතා දක්වා ඇති පාසල්වල ලැයිස්තුවෙන් නම ඉවත් කර ඉහළ ප්‍රමුඛතා ලබා දී ඇති පාසලේ අවසන් ලේඛනයේ පමණක් නම ඉතිරි කළ යුතු ය.

(ඇ) තාවකාලික ලේඛනයේ ඇතුළත් ව සිටි ළමයකුගේ නම අවසන් ලේඛනය සකස් කිරීමේ දී ඉවත් වී අදාළ සංඛ්‍යාව අඩු වන්නේ නම් අදාළ ගණයේ පොරොත්තු ලේඛනයේ ඉහළ සිටින ළමයාගේ නම අවසන් ලේඛනයේ අවසානයට ඇතුළත් කළ යුතු ය.

11.4 (අ) එක් එක් ගණවල වෙන වෙන ම අවසාන ලැයිස්තුව හා පොරොත්තු ලේඛනය පිටපත් 04කින් සකස් කර අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සියලු ම සාමාජිකයන් විසින් අදාළ ලේඛනවල සියලු ම පිටුවල අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් පරීක්ෂණයට ලක් කළ ළමුන් සඳහා පමණක් වගකියනු ලබන බවට සටහනක් තබා අත්සන් තැබිය යුතු ය. පසු ව අදාළ පාසලේ විදුහල්පති විසින් එම ලේඛන භාර ගෙන ජාතික පාසලක් නම් ජාතික පාසල් සම්බන්ධීකරණ අධ්‍යාපන අධ්‍යක්ෂට හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට එක් පිටපතක් බැගින් ද පළාත් පාසලක් නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට එක් පිටපතක් බැගින් ද ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු අතර, එහි තෙවන පිටපත පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය. සිව් වන පිටපත පාසල් ගොනුවේ ගොනු කර තබා ගත යුතු ය. මීට අමතර ව පළාත් පාසලක් නම් තවත් පිටපතක් ලබා ගෙන පළාත් අධ්‍යාපන ලේකම් වෙත ද එවිය යුතු ය.

(ආ) දැන්වීම් පුවරුවේ යොදන ලේඛන දෙක (අවසාන ලැයිස්තුව හා සංශෝධිත පොරොත්තු ලේඛනය) සති 02ක් වත් අඛණ්ඩ ව ප්‍රදර්ශනය කළ යුතු ය. මෙම ලේඛන අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ අත්සන් නොමැතිව ප්‍රසිද්ධ කිරීම නොකළ යුතු ය.

11.5 තෝරා ගත් ළමයින්ට ලිඛිත ව විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව සහිත ව (උපලේඛන අංක 02 ආකෘතිය අනුව) දැනුම් දිය යුතු ය,

11.6 තෝරා නොගත් ළමයින්ට ළමයා අයත් ගණය ද තෝරා නොගැනීමට හේතු ද පැහැදිලි ව සඳහන් කොට ලිඛිත ව දන්වා යැවිය යුතු ය. ළමයින් තෝරා ගැනීමේ දී ඒ ඒ ගණයට සීමා වූ අවම ලකුණු ප්‍රමාණය අනිවාර්යයෙන් ම මේ ලිපියේ සඳහන් කළ යුතු ය. මේ සඳහා මේ චක්‍රලේඛයේ උපලේඛන අංක 03 දරන ආකෘතිය භාවිතා කළ යුතු ය.

11.7 තෝරා ගත් ළමයින්ගේ ලියකියවිලිවල ඡායා පිටපත් අඩංගු ලිපිගොනුවක් එක් එක් ළමයා සම්බන්ධයෙන් පාසලේ තබා ගත යුතු ය. නොතේරුණු ළමයින්ගේ ලිපිගොනු ද වෙන ම තබා ගත යුතු ය.

11.8 අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කරන ලද යම් අයදුම්කරුවකු පිළිබඳ ව අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් දෙනු ලබන තීරණය අවසාන තීරණය වනු ඇත.

11.9 පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම පළමු වාරයේ දී අවසන් කරන අතර ඉන්පසු ඒ ගැන කටයුතු කරනු නොලැබේ.

11.10 පළමු වන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම සම්බන්ධ ව අධීක්ෂණය කිරීමටත් යම් ගැටලුවක් ඇති වුවහොත් එය නිරාකරණය කිරීමට අදාළ තීරණ ගැනීමටත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට අනුලංඝනීය බලය පැවරේ.

12.0 ක්‍රියාත්විත රාජකාරියේ යෙදී සිටින/සිටි ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයන්ට ලබා දී ඇති විශේෂ අනුග්‍රහය

12.1 ක්‍රියාත්විත රාජකාරියේ යෙදී සිටින හෝ යෙදුණු ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයන් විසින් තම දරුවන් පාසල්වලට ඇතුළත් කිරීම සඳහා අයදුම්පත් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හෝ අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කරනු ලැබේ.

12.2 රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මගින් ළමයින් තෝරා ගැනීම සඳහා අදාළ නිර්ණායක හා ලකුණු ක්‍රමයක් සකස් කර ගෙන අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා ගන්නා පාසල් නාමලේඛනයේ සඳහන් පාසල්වලට යොමු කළ හැකි ළමයින් සංඛ්‍යාව තෝරා ගැනේ. මෙහි දී එක් සමාන්තර පන්තියක් සඳහා තෝරා ගත හැක්කේ ළමයින් හත්දෙනකු පමණි.

12.3 එක් එක් පාසලට ක්‍රියාත්විත අනුග්‍රහය මගින් තෝරාගත් ළමයින්ගේ ලැයිස්තු රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මගින් ඔක්තෝබර් මස 30 වන දිනට පෙර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

12.4 රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් පාසල්වලට තෝරා එවනු ලබන ළමයින් පාසලට ඇතුළත් කර ගැනීමට ප්‍රථම අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවටත්, ඉදිරිපත් කරන ලේඛන සත්‍ය බවටත් විදුහල්පතිවරුන් විසින් සනාථ කර ගත යුතු ය.

12.5 රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය සමග මෙම කටයුතු සම්බන්ධීකරණය ජාතික පාසල් සම්බන්ධීකරණ අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඉටු කරනු ඇත.

13.0

13.1 අවසාන ලේඛනයෙන් තෝරාගත් ළමයින් 33 දෙනාත් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් තෝරා එවනු ලබන ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයින්ගේ සුදුසුකම් ලබන ළමයින් 07 දෙනාත් පංතියක් සඳහා ඇතුළත් කර ගත යුතු ය. මේ අනුව **පළමු වන ශ්‍රේණියේ සමාන්තර පන්තියකට අවසාන වශයෙන් ඇතුළත් කර ගත හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 40කි.**

13.2 තෝරා ගත් අවසන් ලේඛනයේ නම් සඳහන් ළමයින් ඇතුළත් කිරීමෙන් පසුව ද පුරප්පාඩු ඇති වුවහොත්, එම පුරප්පාඩු ඇති වන ගණය අනුව සංශෝධිත පොරොත්තු ලේඛනයේ සඳහන් අනුපිළිවෙළින් පිරවිය යුතු ය.

13.3 ඉන් අනතුරු ව තවදුරටත් පුරප්පාඩු වෙතොත් පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට ද ජාතික පාසලක් නම් ජාතික පාසල් සම්බන්ධීකරණ අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට ද පාසල් ප්‍රධානියා විසින් ඒ බව දැනුම් දී උපදෙස් ලබා ගත යුතු ය. කෙසේ වුව ද මෙම සිසුන් ඇතුළත් කිරීම පළමු වාරය අවසන් වීමට පෙර නිම කළ යුතු ය.

14.0 තෝරා නොගත් ළමයින්ට පාසල් ලබා දීම

14.1. කිසි ම පාසලකට තෝරා නොගත් යම් ළමයකුගේ මව්පිය/ නීත්‍යනුකූල භාරකරු විසින් තමන්ගේ ළමයාට විකල්ප පාසලක් ලබා ගැනීම සඳහා තමන් පදිංචි ප්‍රදේශයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නව අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය. ඒ අනුව කිසි ම පාසලක් නොලැබු ළමයින්ට පාසල් ලබා දීම කලාප අධ්‍යක්ෂගේ වගකීම වේ.

14.2. තෝරා නොගත් ළමයින් පිළිබඳ වාර්තාවක් විදුහල්පති විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය. මේ වාර්තාව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කිසිදු පාසලක් නොලැබු ළමයින්ට පාසලක් ලබා දීමේ දී උපයෝගී කර ගත යුතු ය.

15.0 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලවල සහ අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලවල සාමාජිකයන් සඳහා ද එම කටයුතු වෙනුවෙන් ද යම් වියදමක් දැරීමට සිදු වන්නේ නම් ඒ සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අවසරය මත පාසල් සංවර්ධන සමිති/ පාසල් නගා සිටුවීමේ ගිණුමෙන් වියදම් කළ හැකි ය.

16.0 කාල රාමුව

පළමු වන ශ්‍රේණියට ළමයින් තෝරා ගැනීමේ වැඩ කටයුතු පහත සඳහන් කාල රාමුවට අනුව අනිවාර්යයෙන් ම නිම කළ යුතු ය:-

ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනය	ජුනි 30 වන දිනට ප්‍රථම
සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම	සැප්තැම්බර් 15 ට පෙර
තාවකාලික ලැයිස්තුව දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම	සැප්තැම්බර් 30
අභියාචනා හා විරෝධතා භාර ගැනීමේ අවසාන දිනය	ඔක්තෝබර් 15
අභියාචනා හා විරෝධතා පරීක්ෂණය	ඔක්තෝබර් 25 - නොවැම්බර් 20
අවසාන ලේඛනය ප්‍රසිද්ධ කිරීම	දෙසැම්බර් 01
පළමු වන ශ්‍රේණියේ පන්ති ආරම්භ කිරීම	පළමු වන පාසල් වාරය ආරම්භ වන පළමුවන දිනය

16.1 දෙසැම්බර් මස අග සති දෙක ඇතුළත තෝරා ගත් ළමයින් හඳුනා ගැනීම සඳහා කණ්ඩායම් වශයෙන් පාසල්වලට ගෙන්වා ගත යුතු අතර, ජනවාරි මස පළමු වන සතියේ දී පළමු ශ්‍රේණියේ පන්ති විධිමත් ලෙස ආරම්භ කළ යුතු වේ.

17.0 පොදු කරුණු

17.1 පාසල්වලට ළමයින් ඇතුළත් කිරීම සම්බන්ධ ව සමස්ත ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ජාතික පාසල් සම්බන්ධයෙන් රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ද, පළාත් පාසල් සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන ලේකම් ද දැනුවත් කළ යුතු ය.

17.2 පාසලින් මව්පියන් වෙත යොමු කරනු ලබන ලිපි සම්බන්ධයෙන් විමසීම් කරන විට දී එයට අදාළ තොරතුරු ලබා දීම සඳහා එසේ යොමු කරනු ලබන ලිපි පිළිබඳ සවිස්තර වාර්තාවක් පාසල තුළ රඳවා තබා ගැනීමට කටයුතු කළ යුතු ය.

17.3 ත්‍රස්තවාදී ක්‍රියා හේතුකොට හෝ ස්වාභාවික ව්‍යසන හේතු කොට ගෙන අවතැන් වූ පවුල්වල දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමේ දී උප්පැන්න සහතික ආදිය නොමැති වූ විට, එකී පවුල් ත්‍රස්තවාදී ක්‍රියාවලට භාජන වූ බවට/ ස්වභාවික ව්‍යසනයට පත් වූ බවට ග්‍රාම නිලධාරී සහතිකය, අනාථ කඳවුරු සහතිකය ආදිය සලකා බලා සුදුසු පරිදි ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතු ය. එහෙත් උපන් දිනය සනාථ කිරීම සඳහා දිවුරුම් පෙත්සමක් ලබා ගත යුතු අතර පසු ව උප්පැන්න සහතිකය ලබා ගත යුතු ය.

17.4 විධිමත් පාසල්වලට ඇතුළත් නොවූ පාසල් යා යුතු වයසේ ළමයින් හා නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන යටතේ සාක්ෂරතා පන්තිවලට සහභාගි වී සාක්ෂරතා කුසලතා ලැබූ ළමයින් ඔවුන්ගේ වයස හා ප්‍රවීණතාව සලකා සුදුසු පන්තිවලට ඇතුළත් කර ගැනීමට හැකි ය. සාක්ෂරතා පන්තිවලට හෝ වෙනත් පාසලකට නොගියත් විදුහල්පති ඇතුළු මණ්ඩලයක් මගින් ළමයාගේ දක්ෂතා පරීක්ෂා කර බලා පුරප්පාඩු අනුව ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය. ශිෂ්‍යයන් සඳහා උප්පැන්න සහතිකය නැතහොත් ඒ වෙනුවට දිවුරුම් පෙත්සමක් පිළිගත හැකි ය.

17.5 විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමයින්ට ලබා දෙන සහනය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඒ පිළිබඳ ව නිකුත් කර ඇති චක්‍රලේඛ විධි විධානවලට අනුව සිදු කළ යුතු ය.

18.0 ළමයින් ඇතුළත් කිරීම සඳහා මුදල් සහ වෙනත් ආධාර ලබා ගැනීම තහනම් කිරීම

සියලු ම රජයේ පාසල් හා ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල්වලට ළමයින් ඇතුළත් කිරීමේ දී පහසුකම් හා සේවා ගාස්තු සහ පාසල් සංවර්ධන සමිති සාමාජික මුදල හැර වෙනත් ගාස්තු හෝ ආධාර මුදල් හෝ වෙනයම් බඩු බාහිරාදියක් හෝ අය කිරීම/ ලබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් වේ. ළමයින් ඇතුළත් කිරීමෙන් පසුව ද එවැනි බලපෑමක් නොකළ යුතු වේ. මෙලෙස බලපෑම් කිරීම සම්පූර්ණයෙන් ම නීති විරෝධී වන අතර, එවැනි අවස්ථාවල ඒ සම්බන්ධ ව දැඩි ලෙස ක්‍රියා කිරීමට සිදු වනු ඇත. පාසල් ප්‍රධානීන් හෝ පාසලට සම්බන්ධ වෙනත් කවර සංවිධානයක් හෝ එලෙස බලපෑම් නො කළ යුතු ය. මෙහි දී සංවිධාන යන්නෙන් ආදි ශිෂ්‍ය සංගම්; පාසල් සංවර්ධන සමිති, පාසල් නගා සිටුවීමේ වැඩසටහන ඇතුළු පාසලට සම්බන්ධ වූ සියලු ම සමිති හා සංගම් අදහස් කෙරේ.

මෙම චක්‍රලේඛයෙන් පැන නගින ඕනෑ ම ගැටලුවක් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

එස්.එම්.ගෝඨාභය ජයරත්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :

1. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්
2. ජාතික අධ්‍යාපන කොමිසම් සභාවේ සභාපති
3. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
4. විභාග කොමසාරිස් ජනරාල්
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
6. විගණකාධිපති
7. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන්
8. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම ශාඛා ප්‍රධානීන්

අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතිය

20........ වර්ෂයේ දී .... පාසලේ

පළමුවන ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා අයදුම් පත්‍රය

(ළමයාගේ උප්පැන්න සහතිකයේ පිටපතක් හා ඉදිරිපත් කර ඇති විස්තර සනාථ කිරීම සඳහා අදාළ වන ලිපි ලේඛනවල පිටපත් අයදුම්කරු විසින් ම සහතික කර මෙයට අමුණා එවිය යුතු ය.)

01. ඉල්ලුම් කරන ගණය : ....

(ගණ කිහිපයකට අයත් නම් වෙන වෙන ම ඉල්ලුම් කළ යුතු ය.)

02. ළමයා පිළිබඳ විස්තර :

2.1 සම්පූර්ණ නම : ....

(වාසගමට යටින් ඉරක් අඳින්න)

2.2 මුලකුරු සමඟ නම : ....

(අගට යෙදෙන එක් නමක් පමණක් ලියන්න උදා - එම්.එම්.එස්.ප්‍රනාන්දු

2.3 ස්ත්‍රී/පුරුෂ බව : ....

2.4 ආගම : ....

2.5 අධ්‍යාපන මාධ්‍ය (සිංහල/ දෙමළ) : ....

2.6 උපන් දිනය : අවුරුද්ද .... මාසය .... දිනය ....

2.7 20...... ජනවාරි මස 31 දිනට වයස : අවුරුදු .... මාස .... දින ....

03. අයදුම්කරු පිළිබඳ විස්තර : මව/ පියා/ නීත්‍යනුකූල භාරකරු

3.1 සම්පූර්ණ නම : ....

3.2 මුලකුරු සමඟ නම : ....

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : ....

3.4 ශ්‍රී ලාංකිකයෙක් ද : ....

3.5 ආගම : ....

3.6 ස්ථිර ලිපිනය : ....

දුරකථන අංකය : ....

3.7 පදිංචි ව සිටින දිස්ත්‍රික්කය : ....

3.8 පදිංචි ස්ථානයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ....

3.9 පදිංචි ස්ථානයට අදාළ ග්‍රාම නිලධාරී වසම : .... අංකය : ....

04. ඉල්ලුම් කරන පාසල් (මෙම පාසල ද ඇතුළු ව තම කැමැත්ත අනුපිළිවෙළට ලිවිය යුතු ය) :

අනු අංකය	පාසලේ නම	පාසලේ වර්ගය (ජාතික/ පළාත්)	පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර
01.			
02.			
03.			
04.			
05.			
06.			

(ඔබගේ ළමයා ඉල්ලුම් කරන ලද පාසල් කිහිපයකට තේරුණු අවස්ථාවේ දී ඔබ විසින් ඉහත සඳහන් කරන ලද ප්‍රමුඛතා අනුපිළිවෙළ සළකා බලා ප්‍රමුඛතාව වැඩි පාසල ඔබ දෙනු ලබන අතර, අනෙකුත් පාසල් ලැයිස්තුවලින් නම ඉවත් කරනු ලැබේ)

05. ඉල්ලුම් කරන මෙම පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න අදාළ දරුවාට ඇතුළත්වීමට හැකි වෙනත් පාසල්:

1. ....
2. ....
3. ....
4. ....
5. ....
6. ....
7. ....
8. ....
9. ....
10. ....

06. ඡන්දහිමි නාමලේඛන ලියාපදිංචිය :

(පදිංචිය සනාථ කිරීමට අවශ්‍ය ගණවලට අදාළ ව මව්පියන්/ නිත්‍යානුකූල භාරකරු විසින් ග්‍රාම නිලධාරී කාර්යාලයෙන් විස්තර ලබා ගෙන මෙම කොටස සම්පූර්ණ කර තමන් විසින් ම සහතික කළ යුතු ය.)

වර්ෂය :

ඡන්ද ප්‍රදේශය :

ග්‍රාම නිලධාරී වසම හා අංකය :

ඡන්ද කොට්ඨාසය :

ගම/ වීදිය, වත්ත :

ගෘහ අංකය	පිළිවෙළ අංකය	ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා)

වර්ෂය :

ඡන්ද ප්‍රදේශය :

ග්‍රාම නිලධාරී වසම හා අංකය :

ඡන්ද කොට්ඨාසය :

ගම/ වීදිය, වත්ත :

ගෘහ අංකය	පිළිවෙළ අංකය	ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා)

වර්ෂය :

ඡන්ද ප්‍රදේශය :

ග්‍රාම නිලධාරී වසම හා අංකය :

ඡන්ද කොට්ඨාසය :

ගම/ වීදිය, වත්ත :

ගෘහ අංකය	පිළිවෙළ අංකය	ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා)

වර්ෂය :

ඡන්ද ප්‍රදේශය :

ග්‍රාම නිලධාරී වසම හා අංකය :

ඡන්ද කොට්ඨාසය :

ගම/ වීදිය, වත්ත :

ගෘහ අංකය	පිළිවෙළ අංකය	ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා)

වර්ෂය -

ඡන්ද ප්‍රදේශය -

ග්‍රාම නිලධාරී වසම හා අංකය -

ඡන්ද කොට්ඨාසය -

ගම/ වීදිය, වත්ත -

ගෘහ අංකය	පිළිවෙළ අංකය	ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා)

ඉහත තොරතුරු ඡන්දහිමි නාමලේඛන පරීක්ෂා කොට මවිසින් නිවැරදි ව සටහන් කර ගත් බව සහතික කරමි.

....

ඉල්ලුම්කරුගේ අත්සන

07. පහත සඳහන් කොටස්වල තමා ඉල්ලුම් කරන ගණයට අදාළ කොටස් පමණක් සම්පූර්ණ කරන්න:

කරුණු	ලකුණු (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

7.1 පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්

(අ)
- ජන්දහිමි නාම ලේඛනයේ ඉල්ලුම්කරු හා කලත්‍රයා යන දෙදෙනා ම / නිත්‍යානුකූල භාරකරු ඇතුළත් ව සිටින වසර ගණන : ....
- ජන්ද හිමි නාම ලේඛනයේ ඉල්ලුම්කරුගේ හෝ කලත්‍රයාගේ හෝ නම පමණක් ඇතුළත් ව සිටින වසර ගණන : .... (අයදුම්පත් ඉදිරිපත් කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට **ආසන්න** වසර 05ක කාලයක් සඳහා මෙය අදාළ වේ)

(ආ) පදිංචි ස්ථානයේ හිමිකම හිමිකම් ඔප්පුව : (ඉල්ලුම්කරුගේ/ කලත්‍රයාගේ නමට හෝ ඉල්ලුම්කරුගේ/ කලත්‍රයාගේ දෙමාපියන්ගේ නමට) ලියාපදිංචි බදු ඔප්පුව/ රජයේ නිල නිවාස ලේඛන/ ලියාපදිංචි නොකළ බදු ඔප්පුව/නිත්‍යානුකූලව පිළිගත හැකි අයිතිය තහවුරු කෙරෙන වෙනත් ලේඛන

....

(ඇ) පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි අතිරේක ලේඛන :

....

(ඈ) ඉල්ලුම් කරන මේ පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න, අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි වෙනත් පාසල් සංඛ්‍යාව : ....

(අනිවාර්යයෙන් ම අංක 06 සම්පූර්ණ කළ යුතු ය.)

7.2 ආදි ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ගේ දරුවන්

(අ) ශිෂ්‍යයකු වශයෙන් පාසලේ ඉගෙනුම ලැබූ කාලය .... සිට ....දක්වා ශ්‍රේණිය .... සිට .... දක්වා

(ආ) පාසල් කාලය තුළ ලබා ගත් අධ්‍යාපන ජයග්‍රහණ :

....

....

....

(ඇ) පාසල් කාලය තුළ විෂය සමගාමී කටයුතුවලින් ලබා ගත් ජයග්‍රහණ :

....

(ඈ) ආදි ශිෂ්‍ය සංගම් සාමාජිකත්වය, පාසල් කාලයෙන් පසු ලබා ඇති අධ්‍යාපන ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා ලබා දුන් විවිධ ආකාරයේ සහයෝග :

....

....

7.3 එවකට තත් පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහෝදර/සහෝදරියන්

(අ) අයදුම්කරුගේ ළමයකු හෝ ළමයින් පාසලේ ඉගෙනුම ලබමින් සිටී නම්

ළමයාගේ නම	ශ්‍රේණිය හා ඇතුළත්වීමේ අංකය	මේ පාසලට ඇතුළත් වූ ශ්‍රේණිය හා ගත කළ ශ්‍රේණි ගණන
1.		
2.		
3.		

(ආ)
- ජන්දහිමි නාම ලේඛනයේ ඉල්ලුම්කරු හා කලත්‍රයා යන දෙදෙනා ම/ නිත්‍යානුකූල භාරකරු ඇතුළත් ව සිටින වසර ගණන: ....
- ජන්දහිමි නාම ලේඛනයේ ඉල්ලුම්කරුගේ හෝ කලත්‍රයාගේ හෝ නම පමණක් ඇතුළත් ව තිබෙන වසර ගණන : ....

(අයදුම්පත් ඉදිරිපත් කරන වර්ෂයකට පෙර වර්ෂයේ සිට ආසන්න වසර 05ක කාලයක් සඳහා මෙය අදාළ වේ)

(ඈ) ඉල්ලුම් කරන මේ පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න අදාළ දරුවා ඇතුළත් වීමට හැකි වෙනත් පාසල් සංඛ්‍යාව: ....

(ඈ) පදිංචි ස්ථානයේ හිමිකම

හිමිකම් ඔප්පුව (ඉල්ලුම්කරුගේ/ කලත්‍රයාගේ නමට හෝ ඉල්ලුම්කරුගේ/කලත්‍රයාගේ දෙමාපියන්ගේ නමට) ලියාපදිංචි බදු ඔප්පුව/ රජයේ නිල නිවාස ලේඛන/ ලියාපදිංචි නො කළ බදු ඔප්පුව/ නිත්‍යානුකූලව පිළිගත හැකි අයිතිය තහවුරු කෙරෙන වෙනත් ලේඛන:

....

(ඉ) පාසලේ සිටින සහෝදර/ සහෝදරියන් පාසලට ලබා දී ඇති ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා ඉල්ලුම්කරු ලබාදුන් විවිධාකාරයේ සහයෝග : ....

(අනිවාර්යයෙන් ම අංක 06 සම්පූර්ණ කළ යුතු ය.)

7.4 අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ දරුවන්

(අ) අදාළ ආයතනවල ස්ථිර සේවකයකු ලෙස තනතුර හා සේවා කාලය : ....

(ආ) පදිංචි ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර : ....

(ඇ) දැනට දුෂ්කර පාසලක සේවයේ යෙදේ නම් දුෂ්කර පාසල් සේවා කාලය : ....

(ඈ) මීට පෙර දුෂ්කර පාසලක සේවයේ යෙදී ඇත්නම් එම සේවා කාලය : ....

(ඉ) ලබා නොගත් නිවාඩු දින ගණන

20... ....
20... ....
20... ....
20... ....
20... ....

(ඊ) දැනට පාසලක සේවයේ යෙදී සිටී නම් පාසලේ නම හා සේවා කාලය : ....

7.5 රජයේ අවශ්‍යතා මත ස්ථාන මාරුවීම් ලැබ පැමිණි නිලධරයන්ගේ දරුවන් :

(අ) අවසානයට ස්ථාන මාරුවීම් ලැබූ දිනය : ....

(ආ) ස්ථාන මාරුවීමට අදාළව පෙර සහ නව සේවා ස්ථානයේ නම හා ලිපිනය:

....

(ඇ) පෙර සේවා ස්ථානයේ සිට මාරුවීම් ලැබ පැමිණි නව සේවා ස්ථානය අතර දුර:

....

(ඈ) ඉල්ලුම් කරන මේ පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි වෙනත් පාසල් සංඛ්‍යාව : ....

(ඉ) රාජ්‍ය / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල/රාජ්‍ය බැංකු සේවකයකු ලෙස සේවා කාලය :

....

(ඊ) ලබා නොගත් නිවාඩු දින ගණන :

20... ....
20... ....
20... ....
20... ....
20... ....

7.6 අදාළ දරුවා සමග විදේශගතව සිට පැමිණෙන තැනැත්තන්ගේ දරුවන් : (අ) විදේශගතව සිට නැවත දිවයිනට පැමිණි දිනය : (ආ) විදේශගතව සිට නැවත දිවයිනට පැමිණි දිනය කාලසීමාව .... දින සිට .... දක්වා (ඇ) විදේශගත වු හේතුව : .... (ඈ) ඉල්ලුම් කරන මේ පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න අදාළ දරුවාට ඇතුළත්වීමට හැකි වෙනත් පාසල් සංඛ්‍යාව :	

08. ප්‍රකාශය :

මගේ ළමයා ඉගෙනීම පිණිස යම්කිසි රජයේ හෝ අනුමත පෞද්ගලික හෝ වෙනත් පාසලකට දැනට නො යන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි. තව ද , මෙහි ඉහතින් සඳහන් කරනු ලැබු තොරතුරු සත්‍ය බවත්, මවිසින් මෙහි සඳහන් කළ ස්ථිර පදිංචිය හා අනෙකුත් තොරතුරු පිළිබඳ සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කිරීමට එකග වන බවත් ප්‍රකාශ කරමි. මවිසින් සඳහන් කරන ලද යම් තොරතුරක් අසත්‍ය/ කූට බව හෙළි වුවහොත් මාගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන බවත් මම දනිමි. මාගේ ළමයා පාසලට ඇතුළත් කළ පසු තොරතුරු අසත්‍ය/ කූට බව හෙළිවුවහොත් ඔහු/ ඇය පාසලෙන් ඉවත් කොට ගෙන අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නම් කෙරෙන ප්‍රදේශයේ වෙනත් පාසලකට ඇතුළත් කිරීමට මම එකග වෙමි.

....

දිනය

....

මවගේ/පියාගේ/නීත්‍යනුකූල භාරකරුගේ අත්සන.

උපලේඛන අංක 02

ඇතුළත් කිරීම සඳහා තෝරාගත් බවට දන්වන ලිපියේ ආකෘතිය

විදුහල : ....

ලිපිනය. : ....

දිනය : ....

.... මයා/මිය,

....

....

පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම - 20..........

ළමයා අයත් ගණය : ....

එම ගණයට තීරණය වූ අවම ලකුණු : ....

ළමයා ලබාගත් ලකුණු : ....

ඔබේ දරුවා වන .... මෙම විද්‍යාලයේ පළමු වැනි ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා තෝරා ගෙන ඇති බව සතුටින් දන්වමි.

එසේ වුව ද තෝරා ගැනීම පිළිබඳ යම් කිසි අක්‍රමිකතාවක් සිදු කර ඇතැයි සනාථ වුවහොත් මේ තෝරා ගැනීම අවලංගු විය හැකි බව සැලකිය යුතු ය.

විදුහල්පතිගේ අත්සන හා
නිල මුද්‍රාව

උපලේඛන අංක 03

ප්‍රතික්ෂේප වූ බව දන්වන ලිපියේ ආකෘතිය

විදුහල : ....

ලිපිනය : ....

දිනය : ....

.... මයා/මිය,

....

....

පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම - 20..........

ළමයා අයත් ගණය : ....

එම ගණයට තීරණය වූ අවම ලකුණු : ....

ළමයා ලබාගත් ලකුණු : ....

ඔබ දරුවා වන .... මෙම ගණයට තීරණය වූ අවම ලකුණට වඩා අඩු ලකුණු ලබාගත් නිසා, ඇතුළත් කර ගැනීමට හැකියාවක් නොමැති බව කනගාටුවෙන් දන්වමි. වෙනත් පාසලක් ලබා ගැනීම සඳහා .... කලාපභාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නව අයදුම්පතක් ඉදිරිපත් කරන්න.

එම ලිපිනය : ....

....

....

....

විදුහල්පතිගේ අත්සන හා
නිල මුද්‍රාව